

පරිගණක අධ්‍යයනායතනය

කොළඹ විශ්වවිද්‍යාලය

වාර්ෂික වාර්තාව

2017

දැක්ම

ඉගෙනුම් ,ඉගැන්වීම් හා පර්යේෂණ
තුළින් දැනුමෙහි සීමා මායිම් අතික්‍රමණය කරමින් පරිගණක අධ්‍යාපනයේ
ගෝලීය නායකයෙකු බවට පත්වීම

මෙහෙවර

පරිගණක අධ්‍යාපනයේ ඉදිරි හා උසස් බව සඳහාත් ගෝලීය උපායමාර්ගික
සබඳතා වර්ධනය කිරීමටත්
අන්තර් ක්ෂේත්‍ර පර්යේෂණ ප්‍රවර්ධනය උදෙසාත්,
ව්‍යවසායකත්ව කුසලතාවෙන් , නායකත්ව ගුණාංගවලින් සහ පරිපූර්ණත්වයෙන්
පිරිපුන් සමාජයීය වගකීමක් සහිත වෘත්තිකයන් නිර්මාණය කිරීම තුළින්
දේශය
කලාපීය දැනුම් කේන්ද්‍රස්ථානයක් වශයෙන්
පිළිගැනීම කෙරෙහි දායක වීම

අධ්‍යක්ෂතුමාගේ සමාලෝචනය



කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය 2017 වාර්ෂික වාර්තාව මා ඉදිරිපත් කරනුයේ බලවත් සතුටින් හා සාඩම්බර හැඟීමෙනි. පරිගණනය ඉගැන්වීමේ හා ඉගෙනීමේ විශිෂ්ට කේන්ද්‍රස්ථානයක් යන්න ප්‍රධාන අරමුණ කරගත් කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක අධ්‍යයනායතනයේ , මෙම වාර්තාව 2017 වර්ෂයේ පැවැත්වූ ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි වැඩසටහන් වලදී ලැබූ සාර්ථකත්වයන්ද ද මුහුණ පෑ අභියෝගයන් ද ඉදිරිපත් කරයි.
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තෝරාගැනීම් ක්‍රියාවලිය යටතේ සිසුන් 809 දෙනෙක් ප්‍රථම උපාධි වැඩසටහන යටතේ ලියාපදිංචි වීමේ අවස්ථාව උදා කරගනු ලැබ, ඉකුත් වසර කිහිපයේ පරිදි ඔවුන්ගේ අධ්‍යනය කටයුතු කරගෙන අතර සිසුන් 244 දෙනෙක් පාඨමාලාව සම්පූර්ණකර වසර අවසානයේ උපාධි ලැබුහ. මෙයට අමතරව කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය විද්‍යා පීඨයේ උපාධි අපේක්ෂකයින් 924 දෙනෙකුට පරිගණක විද්‍යා පාඨමාලා පැවැත්විය.ඔබගේ දැන ගැනීම පිණිස ශිෂ්‍යයින්ගේ සංඛ්‍යාලේඛන සමග උපාධි අධ්‍යාපන ක්‍රියාවලිය මෙම වාර්තාවෙන් විස්තර කෙරේ. කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක අධ්‍යයනායතනයේ බලධාරින්ගෙන් ප්‍රමාණවත් අරමුදල් නොලැබූ අතර වැඩසටහනේ බොහෝ සැලසුම් කල ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම කෙරෙහි එය බලපාන ලදි.

පරිගණක අධ්‍යාපනය සඳහා මහත් ඉල්ලුමක් පවත්නා හෙයින් කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය එහි වඩාත් වැදගත් ජාතික සේවාවක් වන සිසුන් 4650 දෙනෙකු හට ලියාපදිංචි වීමේ අවස්ථාව හිමි වූ BIT බාහිර උපාධි අධ්‍යයනය වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරයි. වසර තුල අයහපත් කාලගුණ තත්වය හේතුවෙන් අවස්ථා කිහිපයකදී හැර කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක අධ්‍යයනායතනයේ සියළුම BIT පරීක්ෂණ නියමිත පරිදි පැවැත්විය. ඉදිරි අධ්‍යයන වර්ෂය තුල සිසුන්ට ඔවුන්ගේ අධ්‍යයන කටයුතු කරගෙන යාමට හැකි පරිදි සියළුම පරීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමට අපට හැකි විය.ඩිප්ලෝමා ප්‍රදාන උත්සවය සහ BIT උපාධි ප්‍රදානෝත්සවය කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක අධ්‍යයනායතනයේ නව ශ්‍රවණාගාරයේදී පැවැත්විනි. දශක කිහිපයකින් පසු විශ්ව විද්‍යාල පරිශ්‍රයේ උපාධි ප්‍රදානෝත්සවයක් පැවැත්වීම නිසා එය සිහි කටයුතු අවස්ථාවකි.

තොරතුරු තාක්ෂණ කර්මාන්තයේ නව වර්ධනයන් මෙන්ම ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) පිළිබඳ සැලකීමෙන් පශ්චාත් උපාධි වැඩසටහන ප්‍රතිශෝධනය කෙරිනි. ප්‍රතිශෝධිත නව වැඩසටහන 2017 දී ආරම්භ කල අතර විස්තර මෙම වාර්තාවේ දැක්වේ. පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ වෙන් කිරීම් ප්‍රමාණවත් නොවන හෙයින් ආයතනයේ තිරසාරත්වයට , පශ්චාත් උපාධි සහ බාහිර උපාධි වැඩසටහන්වල ආදායම් සැලකිය යුතු දායකත්වයක් විය. 2017 වර්ෂයේ තත්ව ආරක්ෂණ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය මෙම වාර්තාවේ දැක්වෙන අතර 2018 වර්ෂයේ වැඩසටහන් සමාලෝචන සඳහා මෙම ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට තීරණය කෙරිණි. 2015 ශූන්‍ය කාර්ය මණ්ඩල පදනම් වූ ප්‍රතිශෝධිත කාර්ය මණ්ඩලය සඳහා කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක අධ්‍යයනායතනයේ අනුමැතිය ලැබිණි. එසේ හෙයින් මෙම මාර්ගෝපදේශ මත ආයතනයේ නව බඳවා ගැනීම් ක්‍රියාවලිය ආරම්භ කරන ලදි.


2017 වර්ෂයේ ප්‍රධාන කේන්ද්‍රීය අභිප්‍රාය වූයේ යටිතල පහසුකම් සංවර්ධනයයි. බහු කාර්ය ශ්‍රවණාගාරය හා දේශන ශාලා ඉදි කිරීම් සඳහා රජයේ අරමුදල් මෙන්ම කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක අධ්‍යයනායතනයේ උත්පාදිත ආදායම් යන දෙකම ආයෝජනය කෙරිණි. කොළඹ විශ්ව විද්‍යාලයේප්‍රධාන ඉතා වැදගත් සිද්ධීන් තුනක් සැමරීමට 2017 ජනවාරි මස සිට ආරම්භ කරමින් ක්‍රියාකාරකම් මාලාවක් කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය විසින් පැවැත්වීය.
1967 දී ගණිත අධ්‍යනංශය කොළඹ විශ්ව විද්‍යාලයට පරිගණක සම්බන්ධ විෂයයන් හඳුන්වා දීම පලමුවන සන්ධිස්ථානය විය . දෙවන සන්ධිස්ථානය වූයේ 1987 දී කොළඹ විශ්ව විද්‍යාලයට පරිගණක තාක්ෂණය හඳුන්වා දීම වූ අතර මෙයට අරමුදල් සැපයුයේ ජපානයේ JICA ආයතනය මගින්ය.තුන්වන වැදගත් සිද්ධිය වූයේ 2002 වර්ෂයේදී කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය පිහිටුවීමයි . 50 වන වාර්ෂික සැමරුමට සමාන්තරව 2017 සැප්තැම්බර් මස නව ශ්‍රවණාගාරය සඳහා නව පස් මහල් ගොඩනැගිල්ල හා දේශන ශාලා නිල වශයෙන් ආරම්භ කරන ලදි. ඊට සමගාමීව පරිගණක ක්ෂේත්‍රයේ ප්‍රමුඛත්වය පවත්වාගෙන යාම සඳහා 2017 වසර තුල පර්යේෂණ හා සංවර්ධනය හා සම්භන්ධ බොහෝ ක්‍රියාකාරකම් සිදු කරන ලදි. නැග එන කලාප සඳහා **ICT** පිළිබඳ අන්තර් ජාතික සම්මන්ත්‍රණය, **ICTer 2017** දැනුම හා භාවිතයන් බෙදා හදාලීමට 2017 සැප්තැම්බර් මස පවත්වන ලදී. 2017 දී නව ව්‍යාපෘති රැසක් ආරම්භ කල අතර යට කී ව්‍යාපෘති පිළිබඳ විස්තර මෙම වාර්තාවේ දැක්වේ. කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණක

අධ්‍යයනායතනයෙහි ශක්තිය රඳා පවතින්නේ එහි මානව සම්පත් මතය. එම නිසා ඔවුන්ගේ ඵලදායීතාව වර්ධනය කිරීමේ අරමුණින් කාර්ය මණ්ඩලයේ වැඩි දියුණුව හා අභිප්‍රේරණය සඳහා බොහෝ ක්‍රියාකාරකම් සැලසුම් කෙරිණි. කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක අධ්‍යයනායතනයේ මෙම වාර්තාවේ සඳහන් පරිදි එහි අනෙකුත් පාර්ශවයන්ගේ සහභාගීත්වය තුලින් ප්‍රජාවට, රජයට හා පෞද්ගලික අංශයට සේවා සැපයීම පවත්වාගෙන යයි.

අවසාන වශයෙන් , 2017 නව යුගයක අද්විතීය වසරක් බවට පත් කිරීමට දායක වූ පාලක සභාව ,සෙනෙට් සභාව, උපකුලපතිතුමා , අධ්‍යක්ෂ මණ්ඩලය , අධ්‍යයන පාලන මණ්ඩලය , කළමනාකාර කමිටුව සහ කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක අධ්‍යයනායතනයේ අනෙකුත් සියළුම කාර්ය මණ්ඩලයට ද මාගේ හදපිරි කෘතවේදීත්වය පිරි නැමීමට අවස්ථාවක් කර ගනිමි.

මහාචාර්ය කේ.පී. හේවාගමගේ
අධ්‍යක්ෂ
කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය (UCSC)

අරමුණු


පරිගණක අධ්‍යාපනය ඉගැන්වීමේ හා ඉගෙනීමේ විශිෂ්ට කේන්ද්‍රස්ථානයක් බවට පත් වීම .]
2. අන්තර්ක්ෂේත්‍ර පර්යේෂණ සඳහා සුවිශේෂී ස්ථානයක් ලබාදෙන අතර ම පරිගණනය සම්බන්ධ පර්යේෂණ ප්‍රවර්ධනය හා සංවර්ධනය [පර්යේෂණ]
3. ව්‍යවසායකත්ව කුසලතා පිරිපුන් නායකත්ව ගුණාංග සහ පරිපූර්ණත්වයට පත් සමාජමය වගකීමක් ඇති වෘත්තිකයන් බිහි කිරීම [ශිෂ්‍ය සංවර්ධනය]
4. ඵලදායී කාර්යය සහ වෘත්තීය ඔප් නැංවීමට සහායතාව දක්වන පරිසරයක් ස්ථාපනය සහ පවත්වාගෙන යාම . [කාර්ය මණ්ඩල සංවර්ධනය]
5. ආයතනික ප්‍රතිරූපය වැඩිදියුණු කිරීම [පාලනය]
6. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය තුළින් සමාජය බල ගැන්වීම[සමාජමය වගකීම]
7. මෙරට දැනුම් කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීම සඳහා සුවිශේෂී දායකත්වයක් මෙන්ම වෘත්තීයමය සේවා සැපයීම [උපදේශනය]

පටුන

දැක්ම 2
මෙහෙවර 2
අධ්‍යක්ෂතුමාගේ සමාලෝචනය 3
අරමුණු 5
කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය 9
සංක්ෂිප්තව 9
කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයෙහි සංවිධාන ව්‍යුහය 10
කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයෙහි ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPIs)පිළිබඳ සඳහනක් (2013-2017) 12
1. පාලනය 15
1.1 **කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයෙහි නිලධාරීන්** 15
1.2 අධිකාරීන් 16
1.2.1 කළමනාකරණ මණ්ඩලය (BOM) 16
1.2.2 මූල්‍ය හා කළමනාකරණ කමිටුව (FMC) 17
1.2.3 විගණන කමිටුව 17
1.2.4 අධ්‍යයන පාලන මණ්ඩලය 18
1.2.5 අධ්‍යයන මණ්ඩල 19
1.2.6 අධ්‍යයනාංශ 25
1.2.7 මධ්‍යස්ථානයයන් 26
2. අධ්‍යාපනය 32
2.1 ප්‍රථම උපාධි අධ්‍යාපනය 32
2.1.1 අභ්‍යන්තර ප්‍රථම උපාධි වැඩසටහන් 32
2.1.2 2016/2017යන වර්ෂය සහ ශිෂ්‍යඅධ්‍ය- බඳවා ගැනීම 33
2.1.3 පරීක්ෂණ වලදී ශිෂ්‍ය කාර්ය සාධනය 35
2.1.4 කර්මාන්තමය ස්ථාපනය කිරීම සහ රැකියා ලැබීමේ හැකියාව 36
2.1.5 උපාධි අපේක්ෂක ශිෂ්‍යයන්ගේ සුභසාධනය 36
2.1.6 UCSC ශිෂ්‍ය සංගම් 42
2.1.7 ශිෂ්‍ය ක්‍රියාකාරකම් 2017 42
2.1.8 ශිෂ්‍ය ජයග්‍රහණ 44
2.1.9 උපාධි ප්‍රදානෝත්සවය 2017 48
2.1.10 **උපාධි අපේක්ෂක ප්‍රදානයන්** 51
2.1.11 රැකියා ලැබීමේ හැකියාව 53
2.2 පශ්චාද් උපාධි අධ්‍යයනය 53
2.2.1 විද්‍යාපති උපාධි වැඩසටහන් 53
2.3 බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා 57
2.3.1 තොරතුරු තාක්ෂණවේදී)බාහිර(උපාධි වැඩසටහන 57

2.3.2 විස්තාරිත පාඨමාලා....60
2.3.3 මාර්ගගත විස්තාරිත වැඩසටහන්....61
2.4 විදේශීය සිසුන්....61
3. පර්යේෂණ....63
3.1 පර්යේෂණ, නවෝත්පාද න සහ ප්‍රකාශන....63
3.1.1 ප්‍රථම උපාධි මට්ටමේ පර්යේෂණ ව්‍යාපෘති....63
3.1.2 විද්‍යාපති මට්ටමේ ව්‍යාපෘති....64
3.1.3 පර්යේෂණ උපාධිවල ව්‍යාපෘති....64
3.1.4 අරමුදල් සැපයෙන පර්යේෂණ ව්‍යාපෘති....65
3.1.5 UCSC පර්යේෂණ අරමුදල – ව්‍යාපෘති සහ උපයෝගිතා....67
3.1.6 UCSC හි පර්යේෂණ කණ්ඩායම්....68
3.1.7 පර්යේෂණ ප්‍රකාශන සහ සම්මාන....70
3.1.8 UCSC හි පර්යේෂණ ක්ෂේත්‍රවල පැතිකඩ....72
3.1. 9 මහාචාර්ය වී- සමරනායක දේශනය .කේ.2017....74
3.1.10 ජාත්‍යන්තර සම්මන්ත්‍රණ - ICTer2017....74
3.1.11 අන්තර්ජාතික සහරා –ICTER....77
3.1. 12 පර්යේෂණ ප්‍රකාශන -2017....79
4. මානව සම්පත් – අධ්‍යයන සහ අනධ්‍යයන....85
4.1 UCSC කාර්ය මණ්ඩලය....85
4.2 UCSC කාර්ය මණ්ඩලයේ සමස්ථ පැතිකඩ....88
4.3 UCSC කාර්ය මණ්ඩල ඇගයීම....89
4.4කාර්ය මණ්ඩල සංවර්ධනය සහ පුහුණුව....89
4.4.1 වෛද්‍යාධාර යෝජනාක්‍රමය....90
4.4.2 UCSC හි සුභ සාධක සංගමය....90
5. ආයතනික සංවර්ධනය....93
5.1 තත්ව ආරක්ෂණ සහ ප්‍රත්‍යයන මැදිරිය....93
5.2 යටිතල පහසුකම් සංවර්ධනය....95
5.2.1 ශ්‍රවණාගාරය විවෘත කිරීම - සැප්තැම්බර් 2017....95
5.3 ආයතනික පිලිගැනීම වැඩි දියුණුකර ගැනීම....96
6. මූල්‍ය....99
6.1 පුනරාවර්තන වියදම්....99
6.2 ප්‍රාග්ධන වියදම්....99
6.3 උපදේශනය සහ පර්යේෂණ ව්‍යාපෘති(*බාහිර අරමුදල් සපයන ලද*)....100
6.4 මූල්‍ය සහාය පිළිබඳ විශ්ලේෂණය සහ උත්පාදිත ආදායම....101
6.4.1 මූල්‍යමය කාර්යසාධන විශ්ලේෂණය රු .000'....101
6.4.2 කාශය තත්ත්වය පිළිබඳ ඒකාබද්ධ ප්‍රදිනට මූල්‍ය 31 දෙසැම්බර් මස 2017....102

6.4.3 2017දෙසැම්බර් 31දිනට මූල්‍ය කාර්ය සාධනයේ ඒකාබද්ධ ප්‍රකාශනය 103
6.4.4 31 දෙසැම්බර් 2017අවසන් වන වර්ෂය සඳහා මුදල් ප්‍රවාහය පිළිබඳ ඒකාබද්ධ වාර්තාව 103
6.5 අවසන්වන වසර සඳහා ස්කන්ධ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය 105
6.6 සටහන් 105
සටහන 01 මුදල් සහ මුදල් සමාන දෑ 105
සටහන 02 ලැබිය යුතු හා පෙර -ගෙවුම් 106
සටහන 03 ඉන්වෙන්ටරි 107
සටහන 04 දේපල, යන්ත්‍ර හා උපකරණ 108
සටහන 05 වෙනත් ජංගම වගකීම් 109
සටහන 06 විශ්‍රාම ප්‍රතිපාදන 111
සටහන 07 112
සටහන 07(A) 112
සටහන 07(B) 112
සටහන 08 113
සටහන 08(A) 113
සටහන - 09 සංචිත 115
සටහන - 10 සීමා කල අරමුදල් 115
6.7 විගණන වාර්තාව 117
6.8 විගණන විමසුම සඳහා පිළිතුරු 127
6.8.1 නොසැසඳුන පාලන ගිණුම් 127
6.8.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් 127
6.8.3 නීති රීති රෙගුලාසි කළමනාකරණ හා තීරණවලට යොමුව 128
6.8.4 මූල්‍ය ප්‍රතිඵලය 128
6.8.5 කාර්ය සාධනය 129
6.8.6 කළමනාකරණ ක්‍රියාකාරකම් 129
6.8.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා 130
6.8.8 හඳුනාගන්නා ලද පාඩු 131
6.8.9 කාර්ය මණ්ඩල පරිපාලනය 131
6.8.10 තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ලඟාකර ගැනීම 131
6.8.11 අයවැය ලේඛනමය පාලනය 132
6.8.12 අභ්‍යන්තර විගණනය 132
6.8.13 ප්‍රසම්පාදනය 132
6.8.14 නොවිසඳී ඇති විගණන ඡේද 133
7. UCSC විශේෂ අවස්ථා 2017 – දෘශ්‍යතාව, සිදුවීම් සහ ක්‍රියාකාරකම් 136
7.1 මාසික විශේෂ අවස්ථා 136
7.1.1 ක්‍රියාකාරකම් , සිදුවීම් සහ වැඩසටහන් 136

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය
සංක්ෂිප්තව

පරිගණක විද්‍යාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සඳහා අධ්‍යාපනය සැපයීම,ප්‍රවර්ධනය හා සංවර්ධනය අරමුණු කර ගනිමින් 1995 අංක 1 දරණ විශ්වවිද්‍යාල (සංශෝධන) පනතින් අවසන් වරට සංශෝධනය කරන ලද 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතෙහි 24 A(1) වගන්තියෙන් දෙන ලද නියෝග ප්‍රකාරව කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක විද්‍යා දෙපාර්තමේන්තුව(DCS) සහ පරිගණක තාක්ෂණායතනය (ICT) ඒකාබද්ධ කිරීමෙන් උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක් වශයෙන් කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය 2002 වසරේ සැප්තැම්බර් මස 1 ස්ථාපනය කරන ලදී. එය පරිගනකය පිළිබඳ අන්තර් ජාතික දැනුම කේන්ද්‍රස්ථානයක් මෙන්ම දිවයිනේ පරිගනක අධ්‍යාපන සංවර්ධනය හා ප්‍රවර්ධනය සඳහා කොළඹ විශ්ව විද්‍යාලය තුල පිහිටුවා ඇති උසස් අධ්‍යාපන ආයතනයකි.
කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයට සවයත්තාවය හිමිව ඇති අතර 2002 නොවැම්බර් මස 15 වැනි දින ගැසට් පත්‍රයහි(අංක. 1262/32 දරණ) පළකරන ලද ආඥාපනතෙහි එහි ක්‍රියාකාරිත්වය විස්තර කරනු ලැබ ඇත.සංඛ්‍යාංක අධිකරණ වෛද්‍ය විද්‍යා මධ්‍යස්ථානයක් ඇතුළත් කිරීම සඳහා එය 2011 ජූලි මස 22 වැනි දින (ගැසට් පත්‍ර අංක 1715/3 මගින්) සංශෝධනය කෙරිණ.

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතන ආඥාපනත අනුව එම ආයතනය සතුව අධ්‍යයනාංශ 3 කි. එනම්,

පරිගණනය සහ බුද්ධිමය පද්ධති අධ්‍යයනාංශය (CIS)

සන්නිවේදනය හා මාධ්‍ය තාක්ෂණ අධ්‍යයනාංශය(CMT)

තොරතුරු පද්ධති ඉංජිනේරු අධ්‍යයනාංශය (ISE)


කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතන ආඥා පනතට අනුව එහි මධ්‍යස්ථාන කි 6. :

- අංකිත බහුමාධ්‍ය පිළිබඳ උසස් මධ්‍යස්ථානය (ADMTC)
- පරිගණක සේවා මධ්‍යස්ථානය (CSC)
  බාහිර විභාග පිළිබඳ මධ්‍යස්ථානය (EDC)
- ඉ-ඉගෙනුම් මධ්‍යස්ථානය (eLC)
- වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය (PDC)
- සංඛ්‍යාංක අධිකරණ වෛද්‍ය මධ්‍යස්ථානය (CDF)

මෙම අධ්‍යයනාංශ හා මධ්‍යස්ථාන පිළිබඳ වැඩිමනත් තොරතුරු ඉදිරියේදී මෙම වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කෙරේ

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයෙහි සංවිධාන ව්‍යුහය

ආඥාපනතින් ප්‍රකාශිත ව්‍යුහය හා වර්තමාන අවශ්‍යතාවයන් පදනම් කර ගනිමින් කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයෙහි කළමනාකරණ ක්‍රියාකාරකම් පවත්වාගෙන යාම සඳහා සැලසුම් කරන ලද එහි සංවිධාන ව්‍යුහය පහත රූපසටහනෙන් නිරූපණය කෙරේ.අධිකාරිත්වයත් කාර්ය මණ්ඩල වෙන්කිරීමෙහිත් සම්බන්ධිකරණය කරනු ලබන්නේ මෙහි දැක්වෙන සටහනේ ධූරාවලිය ප්‍රකාරවය.


UNIVERSITY OF COLOMBO SCHOOL OF COMPUTING – ORGANIZATIONAL STRUCTURE
Council / U O C
Senate
Vice Chancellor
Board of Management
Academic Syndicate
Finance Management
Audit Committee
Director
R H D
I U D
E E P
Research Projects
Deputy Director
Administration
Finance
Service Units
Centers
Head ISE
Head CIS
Head CMT
Deputy Registrar
Deputy Bursar
Engineering
Network Operations Centre
Library
Quality Assurance Cell
eLC
E D C
ADMTC
P D C
C D F
C S C
S D U
Academic Staff
Academic Staff
Academic Staff
SAR – General Administration
SAR – Examinations
AR – Academic & Publication
SAB – Payments & Accounts
SAB – Supplies & Salaries
Engineer
Information Systems Manager
Librarian
Coordinator
Coordinator
Coordinator
Coordinator
Coordinator
Coordinator
Coordinator
Unit Head
Support Staff
Shroff
Store Keeper

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයෙහි ප්‍රධාන කාර්යසාධන දර්ශක ***(KPIS)*** පිළිබඳ සඳහනක් ***(2013-2017)***

		2013	2014	2015	2016	2017
අධ්‍යාපනය (ලියාපදිංචි/උපාධිධාරී)						
අභ්‍යන්තර ප්‍රථම උපාධි	මුළු	770	757	770	763	809
	ඇතුළු වූ	256	212	256	250	261
	පිට වූ	212	214	247	236	193
විද්‍යා ප්‍රථම උපාධි		1275	1119	997	1060	924
තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව (DIT) බාහිර	මුළු	4175	4535	4075	2188	2109
	ඇතුළු වූ	2034	2379	1890	1602	1631
	පිට වූ	654	611	515	379	403
තොරතුරු තාක්ෂණ උසස් ඩිප්ලෝමාව (HDIT) (බාහිර)	මුළු	2391	2583	2509	756	1259
	ඇතුළු වූ	714	721	690	490	511
	පිට වූ	262	305	339	227	151
තොරතුරු තාක්ෂණ උපාධිය (BIT) (බාහිර)	මුළු	1416	1537	1651	1177	1282
	ඇතුළු වූ	312	347	346	242	233
	පිට වූ	172	194	225	262	217
පශ්චාද් උපාධි	මුළු	303	370	452	454	533
	ඇතුළු වූ	143	209	188	184	243
	පිට වූ	122	107	121	127	150
විස්තාරික වැඩ සටහන්		309	389	339	334	296
පර්යේෂණ						
පර්යේෂණ (MPhil/PhD)	මුළු	39/07	41/09	42/09	36/06	37/06
	ඇතුළු වූ	09	07/06	08/01	01/07	11/02
	පිට වූ	05	3/1	3/1	00/01	03/04
පර්යේෂණ ව්‍යාපෘති	මුළු	05	10	11	34	27
	නව	1	6	3	19	14
ප්‍රකාශන		70	67	71	64	53
උපදේශක සේවා/ප.හා සං. ව්‍යාපෘති						
	දේශීය	10	10	23	24	21
	විදේශීය	-	-	1	2	4
සමාජ වගකීම් වැඩ සටහන්		10	10	10	12	

		2013	2014	2015	2016	2017
පාලනය						
ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලය	සියලු	36	40	38	43	47
	මහාචාර්ය	02	03	03	03	03
	දර්ශන ශූරී	20	20	23	24	27
	පශ්චාත් උපාධි	10	11	09	09	09
ස්ථිර අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය		04	04	04	04	08
තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩලය (උපදේශක සහ සහකාර කථිකාචාර්ය)		15	30	27	21	27
ස්ථිර පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල		40	40	37	46	46
කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය (අනියම් සහ පුහුණුවන්නන් ඇතුළත්ව)		49	42	42	25	25
පර්යේෂණ/ව්‍යාපෘති කාර්ය මණ්ඩලය		11	27	24	18	18
මූල්‍ය						
		2013	**2014**	**2015**	**2016**	**2017**
වාර්ෂික පුනරාවර්තන වියදම (ශ්‍රීලරු.මිලියන)		133	161	307	335	415
භාණ්ඩාගාර ප්‍රදාන (පුනරාවර්තන) (ශ්‍රීලරු.මිලියන)		90	94	122	160	165
භාණ්ඩාගාර ප්‍රදාන (ප්‍රාග්ධන) (ශ්‍රීලරු.මිලියන)		26	15	43	205	107
උත්පාදිත ආදායම		242	247	211	201	263
ප්‍රදේ සඳහා UCSC දායකත්වය (ශ්‍රීලරු.මිලියන) (උත්පාදන %)		88 (37%)	185 (75%)	122 (58%)	147(48 %)	131 (50%)
UCSC අයවැය (ශ්‍රීලරු.මිලියන)		363	479	577	622	424
පර්යේෂණ / ව්‍යාපෘති (ශ්‍රීලරු.මිලියන)		9.3	9.7	14	11	11
සේවකයකු සඳහා පිරිවැය (ශ්‍රීලරු. ‘000s) වසරකට		774	795	881	1,008	1,081
ශිෂ්‍යයකු සඳහා පිරිවැය (ශ්‍රීලරු ‘000s) – භාණ්ඩාගාර පුනරාවර්තන		152	190	195	269	310
යටිතල පහසුකම්						
පුස්තකාල පොත්		8,303	8,678	8,783	8,931	8,810
පරිගණක : කාර්ය මණ්ඩලය		1:1				1:1
පරිගණක : ශිෂ්‍යයන් (සාමාන්‍ය සිසුන්) (විශේෂ සිසුන්)		1:4 1:1				1:4 1:0.6
ඉඩකඩ ප්‍රයෝජ්‍යකරණය (සේවක) (වර්ග මී.)		10.42	11.70	11.70	11.70	39.85
ඉඩකඩ ප්‍රයෝජ්‍යකරණය (ශිෂ්‍යය) (වර්ග මී.)		2.68	4.77	4.77	4.77	4.39

පාලනය

1.පාලනය

මෙම වාර්තාවේ ආරම්භයේදී සඳහන් කල අරමුණු 7 සඳහා යොමුවමින් 2017-2022 සංයුක්ත සැලැස්ම පදනම් කර ගනිමින් 2017 වර්ෂයේ ආයතන ක්‍රියාකාරකම් සිදුකරන ලදී. ඉදිරි පස්වසර සඳහා සැලසුම් කල ක්‍රියාකාරකම් සමඟ 2017 වර්ෂයේ ක්‍රියාකාරකම් සැලස්ම පදනම් කර සංයුක්ත සැලැස්ම සකසන ලදී. වර්තමාන අධ්‍යක්ෂ මහාචාර්ය කේ. පී. හේවාගමගේ මහතා 2016 ජුනි මසදී පත්කල පසු පෙර සැලැස්මේ දැක්වූ අරමුණු හත සඳහා යොමුවමින් විවිධ පාර්ශ්වයකරුවන්ගේ ප්‍රතිපෝෂණ හා ප්‍රගතීන් සැලකිල්ලට ගෙන 2017-2022 සංයුක්ත සැලැස්ම ප්‍රතිශෝධනය කිරීමට තීරණය විය.

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයෙහි කළමනාකරණය මෙහෙයවනු ලබන්නේ එම අංශයේ අධ්‍යනාංශ ප්‍රධානීන්,නියෝජ්‍ය ලේඛකාධිකාරී, නියෝජ්‍ය මූල්‍යාධිකාරී,මධ්‍යස්ථාන සම්බන්ධීකාරකවරුන් සහ අනෙකුත් පරිපාලන කාර්යමණ්ඩලයේ සහාය ඇතිව එහි අධ්‍යක්ෂවරයා විසිනි. කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයහි සියලුම ව්‍යවස්ථාපිත හා තේරීම් කමිටුවල සභාපති වශයෙන් කටයුතු කරනු ලබන්නේ අධ්‍යක්ෂවරයා ය.

1.1 කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයෙහි නිලධාරීන්

අධ්‍යක්ෂ මහාචාර්ය කේ.පී. හේවාගමගේ

නියෝජ්‍ය අධ්‍යක්ෂ ආචාර්ය ඩී.ඒ.එස්.අතුකෝරළ

ප්‍රධානීන් ආචාර්ය ඩී.ඒ.එස්.අතුකෝරළ-පරිගණනය සහ බුද්ධිමය පද්ධති අධ්‍යයනාංශය (CIS)

ආචාර්ය ජී.ඩී.එස්.පී. විමලරත්න -සන්නිවේදනය හා මාධ්‍ය තාක්ෂණඅධ්‍යයනාංශය (CMT)

ආචාර්ය එම්.ඩී.ජේ.එස්. ගුණතිලක (තොරතුරු සහ පද්ධති ඉංජිනේරු අධ්‍යයනාංශය (ISE)

නියෝජ්‍ය ලේඛකාධිකාරී කේ.කේ. කේ. ධර්මතිලක මහතා (2017 පෙබරවාරි සිට සප්තවාර්ෂික නිවාඩු මත) / එච්. පී. හේනේගම මිය (2017 අගොස්තු - දෙසැම්බර්)

නියෝජ්‍ය මූල්‍යාධිකාරී ඊ.එම්. ගුණරත්න මහතා

සම්බන්ධීකාරකවරු එස්.ටී.නන්දසාර මහතා -උසස් ඩිජිටල් මාධ්‍ය තාක්ෂණ මධ්‍යස්ථානය(ADMTC)

ආචාර්ය කේ. එල්. ජයරත්න - පරිගණක සේවා මධ්‍යස්ථානය (CSC)

එල්.පී. ජයසිංහ මහතා - බාහිර උපාධි මධ්‍යස්ථානය (EDC)

ආචාර්ය ඩී.ඩී. කරුණාරත්න - e- ඉගෙනුම් මධ්‍යස්ථානය (eLC)

ආචාර්ය එස්.එම්.කේ.ඩී.අරුණතිලක - වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය (PDC)

කේ.එස්. ගුණතිලක මහතා - ඩිජිටල් අධිකරණ වෛද්‍ය විද්‍යා මධ්‍යස්ථානය (CDF)

1.2 අධිකාරීන්

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතන ආඥාපනතින් විස්තර කෙරෙන පරිදි මෙම අධ්‍යයනායතනයෙහි අධිකාරීන් වන්නේ කළමනාකරණ මණ්ඩලය, අධ්‍යයන පාලක මණ්ඩලය,අධ්‍යයන මණ්ඩල; අධ්‍යයනාංශ සහ මධ්‍යස්ථාන යි.

1.2.1 කළමනාකරණ මණ්ඩලය (BOM)

2017 වසරේ දී කළමනාකරණ මණ්ඩලය මගින් මාසික රැස්වීම් 12 ද විශේෂ රැස්වීම් 02 පවත්වන ලදී.පළමු වැනි බ්‍රහස්පතින්දා දිනය සාමාන්‍යයෙන් කළමනාකරණ මණ්ඩල රැස්වීම් සඳහා වෙන්කර ඇත. රැස්වීම් වාර්තා,සටහන් සහ මැමයන් රැස්වීමට පෙර බෙදා දෙනු ලැබේ. රැස්වීම්වලට සහභාගිවීමේ සංඛ්‍යාලේඛණ සමගින් කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය පහත දැක්වේ.

නිල සාමාජිකයන්	
• අධ්‍යක්ෂ	මහාචාර්ය කේ.පී. හේවාගමගේ (P-13 සහ E-1)
• නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ CIS ප්‍රධානී	ආචාර්ය ඩී.ඒ.එස් .අතුකෝරළ(P-14)
• උසස් අධ්‍යාපන නාමික ලේකම්	එම්.දේවසුරේන්ද්‍ර මහතා (P-12 සහ E-2)
• නාමික , මුදල් අමාත්‍යාංශය	ඩී.එම්.ඒ.හරස්ගම මිය (P-8 ජුනි දක්වා)
• පීඨාධිපති,විද්‍යා පීඨය	මහාචාර්ය කේ.ආර්.ආර්. මහානාම (P-12සහ E-1 සහ A-1)
• CMT ප්‍රධානී	ආචාර්ය ජී.ඩී.එස්.පී. විමලරත්න (P-10, E-3සහ L-1)
• ISE ප්‍රධානී	ආචාර්ය එම්. ඩී.ජේ.එස්. ගුණතිලක (P-12, E-1සහ A-1)
අනෙකුත් සාමාජිකයන්	
• අධ්‍යයන පාලන මණ්ඩලය සාමාජිකයෝ (02)	ජේ.එම්. ස්වාමිනාදන් මහතා (P-8, E-3 සහ A-3) සී. මුබරක් මිය (P-12, සහ E-2)
• සෙනෙට් සාමාජිකයෝ (02)	මහාචාර්යසුමේධා ජයනෙත්ති(P-11 ,E-1 සහA -2) ආචාර්ය පවිත්‍රා කෙලාසපති (P-12 සහ E-2)
• විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නාමිකයෝ(02)	රුවන් කෑරගල මහතා (P-1, E-3සහ A-2) ජුනි දක්වා දේශමාන්‍ය එම්.ඩී.ඩී. පීරිස් මහතා (P-14) මහාචාර්ය කේ. ඩී. ගුණවර්ධන (P-5)අගෝස්තු සිට
• තොරතුරු තාක්ෂණ කර්මාන්ත නියෝජිතයෝ (02)	මනෝ සේකරම් මහතා (P-4, E-1සහ A-9) රනිල් රාජපක්ෂ මහතා (P-3 , E-3සහ A-8)
• අධ්‍යයන පාලක මණ්ඩලයේ නාමිකයෝ (03)	එස්.ටී.නන්දසාර මහතා (P-14) ආචාර්ය සි.අයි.කැප්පැටියාගම (P-14) ආචාර්ය ටී.එන්.කේ .සොයිසා (P-13 සහ L -1)

P-පැමිණි, E-නිදහස් කළ , A-නොපැමිණි L-නිවාඩු

1.2.2 මූල්‍ය හා කළමනාකරණ කමිටුව (FMC)

මූල්‍ය හා කළමනාකරණ කමිටුව (FMC) යනු අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අදාළ තීරණ ගැනීමට ප්‍රථම මූල්‍යමය ක්‍රියාකාරකම් පිළිබඳව සවිස්තරාත්මක ලෙස සාකච්ඡා කිරීමට කළමනාකරණ මණ්ඩලයට සහාය දක්වන උප කමිටුවකි.මෙම කමිටුවට 2017 වසරේ දී 3 වතාවක් හමුවීමට හැකි වූ අතර කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයෙහි අධ්‍යක්ෂවරයා එහි සහභාගිත්වය දැරීය.

සභාපති	මහාචාර්යකේ.පී.හේවාගමගේ(P-3)
නියෝජ්‍ය අධ්‍යක්ෂ	ආචාර්ය ඩී.ඒ. එස්.අතුකෝරාළ (P-3)
මණ්ඩල නාමිකයන්	මහාචාර්යකේ.ආර්.ආර්.මහානාම (P-2) දේශමාන්‍ය එම්.ඩී.ඩී. පීරිස් මහතා (P-3) ආචාර්ය පවිත්‍රා කෙලාසපති(P-3) මනෝ සේකරම් මහතා (P-0)
නියෝජ්‍ය මූල්‍යාධිකාරී	ඊ.එම්.ගුණරත්න මහතා (P-3)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි	ප්‍රියන්තා වීරසිරි මිය (P-0)

P-පැමිණි, E-නිදහස් කළ , A-නොපැමිණි L-නිවාඩු

1.2.3 විගණන කමිටුව

විගණන කමිටුව (AC) යනු අධ්‍යක්ෂ මණ්ඩලයේ දී උචිත තීරණ ගැනීමට ප්‍රථම අභ්‍යන්තර විගණන වාර්තා සහ අවසන් විගණන වාර්තා සම්බන්ධ ගැටළු සාකච්ඡා කිරීම සඳහා එකී මණ්ඩලයට සහාය දක්වන උප කමිටුවකි. සාමාන්‍යයෙන් එහි මුලසුන හොබවන්නේ කළමනාකරණ මණ්ඩලයේ විශේෂ නාමිකයකු වේ. අධ්‍යක්ෂතුමා සහ නියෝජ්‍ය අධ්‍යක්ෂතුමා කමිටුවෙහි ආරාධිතයෝ වෙති. විගණකාධිපති දෙපාර්තමේන්තුව,කොළඹ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව යනාදි ආයතනවල නියෝජිතයෝ ද මේ සඳහා ඇරයුම් ලබති. අර්නස්ට් ඇන්ඩ් යන්ග් සමාගමේ නියෝජිතයින්ටද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද අභ්‍යන්තර නියෝජිතයන්ට ද මෙම රැස්වීම් සඳහා ආරාධනා කෙරෙති.2017 වසරේ දී පවත්වන ලද රැස්වීම් 4 කට සහභාගිවූවන්ගේ සංඛ්‍යාලේඛන එක් එක් සාමාජිකයාට අදාළව පහත දැක්වේ.

සභාපති	ඩී.එම්.ඒ.හරස්ගම මිය 2017 ජුනි 19 දින දක්වා (P-2) මහාචාර්ය කේ.ඩී .ගුණවර්ධන -2017අගෝස්තු 20 සිට(P-2)
මණ්ඩල නාමිකයන්	එම්. දේවසුරේන්ද්‍ර මහතා (P-4) රුවන් කෑරගල මහතා (E-4)
විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිත	ඩබ්. ඒ. ටී. ජී. වීරක්කොඩි මිය (P-3)
අභ්‍යන්තර විගණක /UGC	එම් .එම්.ජේ.ආර්.ජානක බෝගමුව මහතා(P-3)
අභ්‍යන්තර විගණක/UOC	කේ.ඊ. ඩබ්. ජයසිරි මහතා (P-3 සහ E-1)
නියෝජිත /E ඇන්ඩ් Y විගණකවරු	ජී.ඩී.ඒ. වීරසූරිය මිය. (P-4)
අධ්‍යක්ෂ නිරීක්ෂණ	ආචාර්ය කේ. පී. හේවාගමගේ (P-4)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (නිරීක්ෂණ)	ආචාර්ය ඩී. ඒ. එස්. අතුකෝරල (P-3)

P-පැමිණි, E-නිදහස් කළ , A-නොපැමිණි L-නිවාඩු

1.2.4 අධ්‍යයන පාලන මණ්ඩලය

වසර තුළදී අධ්‍යයන පාලන මණ්ඩල රැස්වීම් 11 ක් පවත්වන ලදී. අධ්‍යයන පාලන මණ්ඩලයෙහි සංයුතිය UCSC ආඥාපනතෙහි අර්ථ දක්වා ඇත. තෙවැදෑරුම් අධ්‍යයන මණ්ඩල එනම් ප්‍රථම උපාධිය සඳහා අභ්‍යන්තර අපේක්ෂකයන්ගේ අධ්‍යයන මණ්ඩලය(IUD),පර්යේෂණ සහ උසස් උපාධි සඳහා වන අධ්‍යයන පාලන මණ්ඩලය(RHD) ,බාහිර සහ විස්තාරිත වැඩසටහන් සඳහා වන අධ්‍යයන මණ්ඩලය (EEP) යනාදිය මගින් සිදු කරනු ලබන නිර්දේශ මත අධ්‍යයන පාලන මණ්ඩලයේ තීරණ ගැනේ. අදාල අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයන්ගේ නිර්දේශ පදනම් වූ වැදගත් කරුණු අධ්‍යක්ෂ විසින් සභාගත කෙරේ.

අධ්‍යයන පාලක මණ්ඩලයේදී නිර්දේශිත වැදගත් තීරණ විශ්වවිද්‍යාලයේ නියෝග පදනම්ව කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලය හා සෙනෙට් මන්ඩලය විසින් අනුමත කිරීම අවශ්‍ය වේ. 2017 වසරේ පවත්වන ලද සියලු විධිමත් රැස්වීම්වල වාර්තා විමර්ශනය සඳහා පවතියි.අධ්‍යයන පාලක මණ්ඩලයේ නිල සාමාජිකයන් සහ ඔවුන්ගේ සහභාගිත්වය පිළිබඳ සංඛ්‍යා ලේඛන පහත දැක්වේ.

අධ්‍යයන පාලන මණ්ඩලය

අනුක්‍රමික අංකය	නම සහ තනතුර			අධ්‍යයන පාලක මණ්ඩලයේ සහභාගිත්වය (රැස්වීම් 13ට අදාළව)	
		පැමිණීම්		නොපැමිණීම්	නිදහස් කළ
01	මහාචාර්යකේ.පී.හේවාගමගේ, අධ්‍යක්ෂ	13	100%		
02	ආචාර්ය ඩී.ඒ.එස්.අතුකෝරාළ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය නියෝජ්‍ය අධ්‍යක්ෂ , ප්‍රධානී/CIS	12	92%	01	
03	මහාචාර්යජී.එන්. වික්‍රමනායක , තත්ත්ව සහතිකකරණ මැදිරි ප්‍රධානී	04	31%	04	05
04	මහාචාර්යඑන්.ඩී.කොඩිකාර	08	62%	02	03
05	ආචාර්ය ඒ.ආර්.වීරසිංහ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය	09	69%	02	03
06	ජී.පී. සෙනෙවිරත්න මහතා,ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය	12	92%	01	
07	ජී.කේ.ඒ.ඩයස් මහතා , ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය	13	100%		
08	ආචාර්ය ඩී.එන් .රණසිංහ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය	09	69%	04	
09	ආචාර්ය ඩී.ඩී.කරුණාරත්න , සම්බන්ධීකාරක /e-LC, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය	10	77%	02	01
10	ආචාර්ය ජී.ඩී.එස්.පී. විමලරත්න , ප්‍රධානී / CMT, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය	10	77%	01	02
11	ආචාර්ය එම්.ඩී.ජේ.එස් . ගුණතිලක මිය , ප්‍රධානී/ISE, ප්‍රධානී/ ප්‍රථම උපාධි වැඩසටහන , ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය	10	77%		03
12	ආචාර්ය එච්.එල් .ප්‍රේමරත්න , ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය	08	62%	01	04
13	ආචාර්ය ටී.එන්.කේ . සොයිසා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය	11	85%	01	01

14	ආචාර්ය සි. අයි. කැප්පෙටියාගම , ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය	13	100%		
15	ආචාර්ය කේ.එල්.ජයරත්න, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය	12	92%		01
16	ආචාර්ය ටී.ශ්‍රීධරන් , ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය	09	69%	01	03
17	ආචාර්ය එස්.එම්.කේ.ඩී. අරුණතිලක, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11 ශ්‍රේණිය	09	69%	02	02
18	ආචාර්ය යමායා ඒකනායන මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය	02	15%	10	01
19	ආචාර්ය එච්.ඒ. කල්දේරා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය	12	92%	01	
20	ආචාර්ය එම්.ජී.එන්.ඒ.එස්.ප්‍රනාන්දු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11 ශ්‍රේණිය	12	92%		01
21	එස්.ටී.නන්නදසාර මහතා , සම්බන්ධීකාරක/ ADMTC සහ කථිකාචාර්ය	13	100%		
22	කේ.ජී.එම්.කේ . සිල්වා මහතා, කථිකාචාර්ය	10	77%	01	02
23	ආචාර්ය ටී.එම්.එච්.ඒ.යූසුෆ්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11 ශ්‍රේණිය	07	54%	08	02
24	එම්.ඩබ්.ඒ.සී.ආර්.විජේසිංහ මිය , ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය	11	85%	02	04
25	ඩබ්.වී.වෙල්ගම මහතා , ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය	09	69%		02
26	ආචාර්ය එම්.ඩී.ආර්.එන්.දයාරත්න , ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11 ශ්‍රේණිය	10	77%	01	02
27	ආචාර්ය එච්.ඊ.එම්.එච්.බී.ඒකනායක , ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11 ශ්‍රේණිය	12	92%	01	01
28	ආචාර්ය ටී.ඒ.වීරසිංහ මිය , කථිකාචාර්ය	10	77%	02	01
29	ආචාර්ය එල්. එන්. සී. ද සිල්වා මිය , කථිකාචාර්ය (ආරාධනා පරිදි)	05	38%	--	-
30	ආචාර්ය කේ. එච්. ඊ. එල්. හෙට්ටිආරච්චි , ජෙෂ්ඨ කථිකාචාර්ය , II ශ්‍රේණිය	04	31%	-	01
31	එල්.ජී.ජයසිංහ මයා,උපදේශක 1 ශ්‍රේණිය	09	69%	03	01
32	ආචාර්ය එෆ්.එච්.ඒ.එම්.ප්‍රේමචන්ද්‍ර මිය , කථිකාචාර්ය (පරිවාස)	11	85%	01	01
33	ආචාර්ය එම් .අයි.ඊ. වික්‍රමසිංහ, කථිකාචාර්ය(පරිවාස)	07	54%	04	02
34	කේ.එස්.ගුණතිලක මහතා ,සම්බන්ධීකාරක	10	77%	03	

1.2.5 අධ්‍යයන මණ්ඩල

UCSC ආඥාපනතට අනුව, අභ්‍යන්තර උපාධි අපේක්ෂකයන් සඳහා අධ්‍යයන මණ්ඩල තුනක් පවතින අතර ඒවා ප්‍රථම උපාධිය සඳහා අභ්‍යන්තර අපේක්ෂකයන්ගේ අධ්‍යයන මණ්ඩලය(BOS/IUD),පර්යේෂණ සහ උසස් උපාධි සඳහා වන අධ්‍යයන පාලක මණ්ඩලය(BOS/RHD),බාහිර සහ විස්තාරිත වැඩසටහන් සඳහා වන අධ්‍යයන මණ්ඩලය (BOS/EEP) යනාදී වශයෙන් වේ.UCSC හි අධ්‍යක්ෂවරයා මෙම අධ්‍යයන මණ්ඩලවල මුලසුන දැරීමට නියමිත අතර අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙක් එහි ලේකම් වශයෙන් ද රැස්වීම් සංවිධානය සඳහා පරිපාලන කාර්යමණ්ඩල සාමාජිකයෙකු ද සිටිති.

1.2.5.1 මූලික උපාධිය සඳහා අභ්‍යන්තර අපේක්ෂකයන්ගේ අධ්‍යයන මණ්ඩලය(BOS/IUD)

2017 වසරේ දී , මූලික උපාධිය සඳහා පෙනී සිටින අභ්‍යන්තර අපේක්ෂකයන්ගේ අධ්‍යයන මණ්ඩලය (BOS/IUD)වාර 12ක් විධිමත් ලෙස රැස් වූ අතර එමසියලුම රැස්වීම් පවත්වා ගෙනයාම අදාල පරිපාලනයෙහි කාර්ය මණ්ඩලය විසින් සිදුකරන ලදී. ඉගැන්වීම්, ඉගෙනුම්, ඇගයීම් හා පරිපාලනමය කරුණුවලට අදාළව ප්‍රථම උපාධිය සඳහා පෙනී සිටින උපාධි අපේක්ෂකයන් මුහුණපාන සියලු ගැටළු සම්බන්ධයෙන් මාසිකව පැවැත්වෙන BOS/IUD රැස්වීම් වලදී දීර්ඝව සාකච්ඡා කෙරේ. ශිෂ්‍ය නියෝජිතයන් දෙදෙනෙකු ද මේ සඳහා සහභාගි වූ අතර රැස්වීමේ පළමු අදියර පමණක් ඔවුන් ඉදිරියේ පවත්වන ලදී.මූලික උපාධිය සඳහා පෙනී සිටින අභ්‍යන්තර අපේක්ෂකයන්ගේ අධ්‍යයන මණ්ඩලයෙ(IUD) හි සංයුතිය සහ රැස්වීමට සහභාගි වීමේ සංඛ්‍යාලේඛන පහත දැක්වේ.

අනුක්‍රමික අංකය	නම සහ තනතුර	IUD හි පැමිණීම (රැස්වීම් 12ට අදාළව)			
		පැමිණීම්	නොපැමිණීම්	නිදහස් කළ	නිවාඩු
01	මහාචාර්යකේ.පී.හේවාගමගේ, අධ්‍යක්ෂ	11		01	
02	ආචාර්ය ඩී.ඒ.එස්.අතුකෝරාළ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය නියෝජ්‍ය අධ්‍යක්ෂ , ප්‍රධානී/CIS	10		01	
03	මහාචාර්යජී.එන්. වික්‍රමනායක , තත්ත්ව සහතිකකරණ මැදිරි ප්‍රධානී	--	-	12	
04	මහාචාර්ය එන්.ඩී.කොඩිකාර	10	01	01	
05	ආචාර්ය ඒ.ආර්.වීරසිංහ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය	07	04	01	
06	ජී.පී. සෙනෙවිරත්න මහතා,ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය	12			
07	ජී.කේ.ඒ.ඩයස් මහතා , ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය	09	01	02	
08	ආචාර්ය සී.ඩී.තිලකරත්න මිය ඒකාබද්ධ විශේෂ උපාධි වැඩසටහන	09		03	
09	ආචාර්ය ඩී.එන් .රණසිංහ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය	05	07		
10	ආචාර්ය ඩී.ඩී.කරුණාරත්න , සම්බන්ධීකාරක /e-LC, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය	09	01	02	
11	ආචාර්ය ජී.ඩී.එස්.පී. විමලරත්න , ප්‍රධානී / CMT, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය	07	01	04	
12	ආචාර්ය එම්.ඩී.ජේ.එස් . ගුණතිලක මිය , ප්‍රධානී/ISE, ප්‍රධානී / මූලික උපාධි වැඩසටහන , ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය	12			
13	ආචාර්ය එච්.එල් .ප්‍රේමරත්න , ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය	11		01	
14	ආචාර්ය ටී.එන්.කේ . දි සොයිසා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය	11		01	
15	ආචාර්ය සී. අයි. කැප්පෙටියාගම , ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය	12			
16	ආචාර්ය කේ.එල්.ජයරත්න, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය	12			
17	ආචාර්ය ටී.ශ්‍රීධරන් , ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය	08	01	03	

18	ආචාර්ය එස්.එම්.කේ.ඩී.අරුණතිලක මිය , ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11 ශ්‍රේණිය	10	01	01	
19	ආචාර්ය යමායා ඒකනායක මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය	03		03	08
20	ආචාර්ය එච්.ඒ.කල්දේරා , ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය	09		03	
21	ආචාර්ය එම්.ජී.එන්.ඒ.එස්.ප්‍රනාන්දු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11 ශ්‍රේණිය	11		01	
22	එස්.ටී. නන්දසාර මහතා , සම්බන්ධීකාරක/ ADMTC සහකථිකාචාර්ය	11		01	
23	කේ.ජී.එම්.කේ. සිල්වාමහතා, කථිකාචාර්ය	08	02	02	
24	ආචාර්ය ටී.එම්.එච්.ඒ. යූසුෆ්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11 ශ්‍රේණිය	10		02	
25	එම්.ඩබ්.ඒ.සී.ආර්. විජේසිංහ මිය , ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11 ශ්‍රේණිය	11	01	03	
26	ඩබ්.වී. වෙල්ගම මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11 ශ්‍රේණිය	09		03	
27	ආචාර්ය එම්.ඩී.ආර්.එන්. දයාරත්න , ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11 ශ්‍රේණිය	07	02	03	
28	ආචාර්ය එච්.ඊ්.එම්.එච්.බී.ඒකනායක, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11 ශ්‍රේණිය	11		01	
29	ආචාර්ය රොහාන් සමරසිංහ , ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය , II ශ්‍රේණිය (ආරාධිත)	01	09	02	
30	ආර්. එස්. මදනායක මයා , කථිකාචාර්ය (පරිවාස)	11	00	01	
31	එස්. එස්. පී. මාතරආරච්චි මයා , කථිකාචාර්ය (පරිවාස)	04	01	07	
32	ආචාර්ය ටී. ඒ. වීරසිංහ , කථිකාචාර්ය	11		01	
33	එල්. පී. ජයසිංහ මයා , උපදේශක , II වන ශ්‍රේණිය	02	08	02	
34	ජී. පී. එන්. බොතේජු මයා , උපදේශක , II වන ශ්‍රේණිය	09	01	02	
35	එල්. එන්. සී. ද සිල්වා මිය , කථිකාචාර්ය (පරිවාස)	12			
36	ආචාර්ය එෆ් . එච්. ඒ. එම්. ප්‍රේමවන්ද්‍ර , කථිකාචාර්ය(පරිවාස)	11		01	
37	ආචාර්ය එම්. අයි. ඊ්. වික්‍රමසිංහ , කථිකාචාර්ය (පරිවාස)	11	01		
38	කේ. පී. යූ. ජයසිංහ මයා , කථිකාචාර්ය (පරිවාස)	09		03	
39	ඩී. ඩී. ඒ. සී. ජේ. ජයලත් මයා , කථිකාචාර්ය (පරිවාස)	08	01	03	
40	ඒ. පී. සායක්කාර මයා , කථිකාචාර්ය (පරිවාස)	05		01	06
41	ආර්. එන්. රාජපක්ෂ මයා , කථිකාචාර්ය (පරිවාස)	07	02	03	
42	ආර්. ඒ. වයි. එස්. රනසිංහ මයා , කථිකාචාර්ය (පරිවාස)	09	01	02	
43	ආර්. ඒ. එච්. ඩී. පෙරේරා මයා , කථිකාචාර්ය (පරිවාස)	07		05	
44	ආර්. එම්. යූ. ඒ. රත්නායක මයා , කථිකාචාර්ය (පරිවාස)	06	02	04	

45	ඩී. එන්. පෙරේරා මිය , කථිකාචාර්ය (පරිවාස)	10		02	
46	කේ. වී. ඩී. ජේ. පී. කුමාරසිංහ මයා , කථිකාචාර්ය (පරිවාස)	02	01	01	
47	එච්. එම්. සිරිවර්ධන මයා , කථිකාචාර්ය (පරිවාස)				12
48	ආර්. එම්. පී. එන්. සෝමරත්න මිය , කථිකාචාර්ය (පරිවාස)				12
49	එච්. කේ. ටී. සී. හල්ඔලුව මයා , කථිකාචාර්ය (පරිවාස)				12
50	එස්. ඩී. ගුණවර්ධන මිය , තාවකාලික උපදේශක	05	07		
51	ආචාර්ය පී. වී. කේ. ජී. ගුණවර්ධන , ජ්‍යෙෂ්ඨ ක කථිකාචාර්ය , II වන ශ්‍රේණිය (කොන්ත්‍රාත් ,ආරාධිත)	11		01	
52	ආචාර්ය කේ. එච්. ඊ. එල්. ඩබ්. හෙට්ටිආරච්චි , ජ්‍යෙෂ්ඨ ක කථිකාචාර්ය , II වන ශ්‍රේණිය (කොන්ත්‍රාත් ,ආරාධිත)	12			
53	ආචාර්ය කේ. ඩී. සඳරුවන් , ජේෂ්ඨ කථිකාචාර්ය , II වන ශ්‍රේණිය (කොන්ත්‍රාත් ,ආරාධිත)	10		02	
54	ආර්. ජේ. අමරවීර මයා , අමරවීර මයා , තාවකාලික සහකාර කථිකාචාර්ය , ආරාධිත	09	03		
55	එම්. ඒ. අයි. එම්. ධර්මදාස මයා , තාවකාලික සහකාර කථිකාචාර්ය , ආරාධිත	03	01		
56	එච්. පී. හේනගම මිය , නි/ලේ අධ්‍යයන සහ ප්‍රකාශන	03		01	
57	බී. ඒ. එන්. ක්‍රිෂාන්ත මයා , ජේෂ්ඨ සහකාර ලේඛාධිකාරී , විභාග(ඉදිරියේ)	12			
58	ඩී. කේ. එම්. රත්නායක මිය , ජේ.ස.ලේ , විභාග(ඉදිරියේ)	10	02		
59	එස්. එම්. ජී. එල්. ඒ. සේනාධීර මයා , ශිෂ්‍ය නියෝජිත (ආරාධිත)	01	01		
60	කේ. ඊ. ජයතුංග මයා , ශිෂ්‍ය නියෝජිත (ආරාධිත)	01	01		
61	එල්. එන්. අනුරාධ මයා , (2015/CS/014) /ශිෂ්‍ය නියෝජිත (ආරාධිත)	09	02		
62	එස්. අන්ජන මයා , (2015/CS/002)/ ශිෂ්‍ය නියෝජිත (ආරාධිත)	01	02		
63	බී. එන්. දහනායක මයා , (2013/CS/002)ශිෂ්‍ය නියෝජිත (ආරාධිත)	01			
64	ප්‍රමෝද්‍ය අබේසිංහ මයා , (2015/CS/002)	09			
65	කේ. ටී. ලොරෙන්සුහේවා මයා (2015/IS/040)	02			

1.2.5.2 පර්යේෂණ හා උසස් උපාධි මණ්ඩලය (BOS-RHD)

පර්යේෂණ හා උසස් උපාධි මණ්ඩලය (RHD) යනු UCSC ආඥාපනත යටතේ පිහිටුවන ලද විධිමත් කමිටුවක් වන අතර 2017 වසරේ දී එමගින් රැස්වීම් 12 ක් පවත්වන ලදී.මෙම මණ්ඩලය විසින් පර්යේෂණ සහ පශ්චාද් උපාධිවලට අදාළ කරුණු සම්බන්ධයෙන් මාසිකව සවිස්තරාත්මක සාකච්ඡා පැවැත්වෙන අතර අනුමැතිය අවශ්‍ය වන කරුණු අධ්‍යයන පාලක මණ්ඩලය වෙත යොමු කරනු ලැබේ. මෙකී සියලු කරුණු නිසි පරිදි ලේඛනගත කරනු ලැබ ඇති අතර රැස්වීම් වාර්තා නිසිලෙස කළමනාකරණය කෙරේ. 2017 වසර තුළ පැවැත් වූ RHD රැස්වීම් සංඛ්‍යාව 12 කි. සාමාජිකයන්ගේ සහභාගිත්වය අදාළ සංඛ්‍යා ලේඛණද සමග පහත සඳහන් කෙරේ.

අනුක්‍රමික අංකය	නම සහ තනතුර	RHD හි පැමිණීස (රැස්වීම් 12 ට අදාළව)		
		පැමිණී ඇති	නොපැමිණී ඇති	හිඳුවස්
01	මහාචාර්යකේ.පී.හේවාගමගේ, අධ්‍යක්ෂ	12		
02	ආචාර්ය ඩී.ඒ.එස්.අතුකෝරාළ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය නියෝජ්‍ය අධ්‍යක්ෂ , ප්‍රධානී/CIS	08		04
03	මහාචාර්යජී.එන්. වික්‍රමනායක , තත්ත්ව සහතිකකරණ මැදිරි ප්‍රධානී	03	04	01
04	ජී.පී. සෙනෙවිරත්න මහතා,ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය	12		
05	ආචාර්ය ඩී.ඩී.කරුණාරත්න , සම්බන්ධීකාරක /e-LC, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය	07	02	03
06	ආචාර්ය ජී.ඩී.එස්.පී. විමලරත්න , ප්‍රධානී / CMT, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය	10		01
07	ආචාර්ය එම්.ඩී.ජේ.එස් . ගුණතිලක මිය , ප්‍රධානී/ISE, ප්‍රධානී / මූලික උපාධි වැඩසටහන , ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය	10	01	01
08	ආචාර්ය ටී.එන්.කේ . සොයිසා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය	12		
09	ආචාර්ය කේ.එල්.ජයරත්න, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය	02	02	
10	ආචාර්ය යමායා ඒකනායක මිය,ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය	03		
11	ආචාර්ය එම්. ඒ. කල්දේරා , සම්බන්ධීකාරක MIT වැඩ සටහනන, ජ්‍යෙෂ්ඨ ක කථිකාචාර්ය 1 ශ්‍රේණිය	07		02
12	එස්.ටී.නන්නදසාර මහතා , සම්බන්ධීකාරක/ ADMTC සහ කථිකාචාර්ය	11	01	
13	කේ.පී.එම්.කේ . සිල්වාමහතා, කථිකාචාර්ය	08	02	02
14	එම්.ඩබ්.ඒ.සී.ආර්. විජේසිංහ මිය , ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11 ශ්‍රේණිය	11		01
15	ආචාර්ය එච්. ඊ. එම්. එච්. බී. ඒකනායක , සම්බන්ධීකරණ /MCS වැඩ සටහන	08		
16	ආචාර්ය එස්. එම්. කේ. ඩී. අරුණතිලක මිය	03	03	02
17	ආචාර්ය එස්. එච්. ඒ. එම්. ප්‍රේමචන්ද්‍ර මිය , ව්‍යාපෘති සම්බන්ධීකාරක / MIT	07		01
18	ආචාර්ය පි. වී. කේ. ජී. ගුණවර්ධන, ව්‍යාපෘති සම්බන්ධීකාරක/ MCS	08		
19	ආචාර්ය එම්. අයි. ඊ. වික්‍රමසිංහ , ව්‍යාපෘති සම්බන්ධීකාරක/ MIS	06	01	01

20	එන්. සී. ද සිල්වා මිය	03		

1.2.5.3 බාහිර සහ විස්තාරිත වැඩසටහන් මණ්ඩලය (BOS - EEP)

බාහිර සහ විස්තාරිත වැඩසටහන් මණ්ඩලය (BOS-EEP) යනු UCSC ආඥාපනත මගින් අර්ථ දැක්වූ විධිමත් කමිටුවකි.UCSC මගින් කළමනාකරණය වන බාහිර හා විස්තාරිත අධ්‍යයන වැඩසටහන් හා සම්බන්ධිත සියලු කරුණු සාකච්ඡා කිරීම සඳහා මාසිකව රැස්වීම් පවත්වනු ලැබිණ.එම රැස්වීම්වල සභාපතිත්වය දරනුයේ අධ්‍යක්ෂවරයා වන අතර රැස්වීම් වාර්තා සහ ක්‍රියාකාරකම් කළමනාකරණය සඳහා විධිමත් අධ්‍යයන ලේකම්වරයෙකු සහ පරිපාලන කාර්ය මණ්ඩල නිලධාරියකු ද මෙහි අන්තර්ගතය.2017 වසරේ දී BOS-EEP මගින් රැස්වීම් 12 ක් පවත්වනු ලැබූ අතර විධිමත් සාමාජිකයන්ගේ සහභාගිත්ව සංඛ්‍යාලේඛන පහත දැක්වේ.

අනුක්‍රමික අංකය	නම	EEPහි පැමිණීම (රැස්වීම් 12ට අදාළව)		
		පැමිණීම්	නොපැමිණීම්	හිඳහස්
01	මහාචාර්යකේ.පී.හේවාගමගේ, අධ්‍යක්ෂ	12		
02	ආචාර්ය ඩී.ඒ.එස්.අතුකෝරාළ, නියෝජ්‍ය අධ්‍යක්ෂ , ප්‍රධානී/EEP	10		2
03	මහාචාර්යජී.එන්. වික්‍රමනායක , තත්ත්ව සහතිකකරණ මැදිරි ප්‍රධානී , හිටපු අධ්‍යක්ෂ	05	4	3
04	ආචාර්ය ඩී.ඩී. කරුණාරත්න , සම්බන්ධීකාරක/BIT	07	1	4
05	එස්.ටී. නන්දසාර මහතා, සම්බන්ධීකාරක/ADMTC, ලේකම්/EEP	11		4
06	කේ.එස්. ගුණතිලකමහතා, සම්බන්ධීකාරක/CDF	10		1
07	එල්.පී.ජයසිංහ මහතා, සම්බන්ධීකාරක/EDC සහසම්බන්ධීකාරක/CSC (ඔක්. දක්වා)	11		1
08	ආචාර්ය කේ.එල්.ජයරත්නමහතා , සම්බන්ධීකාරක/CSC (නොවැ.සිට)	08		4
09	ආචාර්ය එස්.එම්.කේ.ඩී. අරුණතිලක මිය , සම්බන්ධීකාරක/PDC	2	7	3
10	ආචාර්ය ඩී.ජී.එස්.පී.විමලරත්න මහතා , නාමික - CMT	10		2
11	ආචාර්ය එම්.ඩී.ජේ.එස් . ගුණතිලක මිය , නාමික - IUD (නොවැ. සිට '16)	6	2	4
12	ආචාර්ය එම්.ජී.එන්. ඒ.එස්. ප්‍රනාන්දු ,නාමික–IUD	8		4
13	විරාජ් වෙල්ගම මහතා ,ව්‍යාපෘති සම්බන්ධීකාරක/BIT	10		2

1.2.6 අධ්‍යයනාංශ

1.2.6.1 පරිගණක හා බුද්ධි පද්ධති අධ්‍යයනාංශය (CIS)

පරිගණක අධ්‍යයන හා බුද්ධි පද්ධති අධ්‍යයනාංශය පරිගණක බුද්ධි පද්ධති පිළිබඳ සෘජු උනන්දුවක් දක්වන ස්ථීර අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින්ගෙන් සමන්විතය. මෙම කාර්ය මණ්ඩල සාමාජිකයින්ගෙන් බොහොමයක් UCSC ප්‍රථම උපාධි පාඨමාලා වලට මෙන්ම පශ්චාද් උපාධි වැඩ සටහන්වලට උගන්වයි. 2017 වර්ෂයේ ධ්‍යයනාංශයේ ප්‍රධානියා වූයේ ආචාර්ය ඩී.ඒ.එස්. අතුකෝරල මහතායි. UCSC වෙබ් අඩවිය වූ www.ucsu.cmb.ac.lk හි කාර්ය මණ්ඩල වෙන්කිරීම් ඇතුළු වැඩිමනත් තොරතුරු දැක්වේ.

1.2.6.2 සන්නිවේදන හා මාධ්‍ය තාක්ෂණ අධ්‍යයනාංශය (CMT)

සන්නිවේදන හා මාධ්‍ය තාක්ෂණ (CMT) අධ්‍යයනාංශය පරිගණක ග්‍රැපික් සම්බන්ධ සෘජු උනන්දුවක් දක්වන ස්ථීර අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ගෙන් සමන්විතය. මෙම කාර්ය මණ්ඩල සාමාජිකයන්ගෙන් බොහොමයක් UCSC හි ප්‍රථම උපාධි පාඨමාලා මෙන්ම පශ්චාද් උපාධි වැඩසටහන් සඳහා උගන්වන අය වේ. 2017 වර්ෂයේ අධ්‍යයනාංශ ප්‍රධානියා වූයේ ආචාර්ය ජී.ඩී.එස්.පී.විමලරත්න මහතායි. කාර්ය මණ්ඩල වෙන්කිරීම් ඇතුලත් වැඩිමනත් තොරතුරු UCSC වෙබ් අඩවියේ දැක්වේ.(www.ucsu.cmb.ac.lk)

1.2.6.3 තොරතුරු පද්ධති ඉංජිනේරු (ISE) අධ්‍යයනාංශය

තොරතුරු පද්ධති ඉංජිනේරු දෙපාර්තමේන්තුව (ISE) තොරතුරු ඉංජිනේරු විද්‍යා හා සෘජු උනන්දුවක් දක්වන ස්ථීර අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ගෙන් සමන්විතය. මෙම කාර්ය මණ්ඩල සාමාජිකයන්ගෙන් බොහොමයක් UCSC හි ප්‍රථම උපාධි වැඩසටහන්වල මෙන්ම පශ්චාද් උපාධි වැඩසටහන්වල ඉගැන්වීමේ නිරතව සිටිති. 2017 වර්ෂයේ අධ්‍යයනාංශයේ ප්‍රධානියා වූයේ අචාර්ය එම්.ඩී.ජේ.එස්.ගුණතිලක මහත්මියයි. කාර්ය මණ්ඩල වෙන්කිරීම් ඇතුළු වැඩිමනත් තොරතුරු UCSC වෙබ් පිටුවේ දැක්වේ. (www.ucsu.cmb.ac.lk)

1.2.7 මධ්‍යස්ථානයයන්

උසස් සංඛ්‍යාක බහු මාධ්‍ය මධ්‍යස්ථානය (ADMTC)

උසස් සංඛ්‍යාක මාධ්‍ය තාක්ෂණ මධ්‍යස්ථානය පිහිටුවන ලද්දේ “UCSC හි හැකියා වර්ධනය තුලින් තොරතුරු තාක්ෂණයේ මානව සම්පත් සංවර්ධනය සඳහා වූ ව්‍යාපෘතිය” ක්‍රියාත්මක කිරීමට කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණන අධ්‍යයනාංශය යටතේ 2002 ජුනි මස හා 2005 මැයි අතර ශ්‍රී ලංකා රජයත් ජපන් රජයත් අතර තුන් අවුරුදු තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘතියක් වශයෙන් ජපාන අන්තර්ජාතික සහයෝගිතා එජන්සියේ (JICA) සහායෙනි.

2017 වර්ෂයේ ADMTC සිදු කල ප්‍රධාන ක්‍රියාකාරකම් පහත දැක්වේ.

- UCSC නව ශ්‍රවණාගාරයේ වගකීම් භාර ගැනීම.
- UCSC ඩිජිටල් ස්ටුඩියෝ නඩත්තුව
- UCSC ඩිජිටල් හා මුද්‍රිත ද්‍රව්‍ය සැකසීම.
- UCSC වෙබ් අඩවිය පවත්වාගෙනයාම
- ග්‍රැපික් සැලසුම් හා නිර්මාණ සංවර්ධනය පිළිබඳ පාඨමාලා පැවැත්වීම.
- UCSC මාධ්‍ය කමිටුව සම්බන්ධීකරණය
- UCSC සම්මන්ත්‍රණයට සහාය - ICTer 2017 (www.icter.org/conference)
- UCSC සංග්‍රහය ප්‍රකාශනය- කලාපවල ICT ප්‍රගමණයන් පිළිබඳ අන්තර්ජාතික සංග්‍රහය ICTer 2017 (www.icter.org/journal

2017 වර්ෂයේ ග්‍රැපික් සැලසුම් හා නිර්මාණ සංවර්ධන පාඨමාලාව 1,8 හා 15 වශයෙන් වූ කාණ්ඩ දෙකක් සඳහා උසස් ඩිජිටල් බහුමාධ්‍ය තාක්ෂණ මධ්‍යස්ථානය (ADMTC) පාඨමලා පැවැත්වීය. සහතික පත් ප්‍රදාන http://ucsc.cmb.ac.lk/events/completion-short-course-graphics-design-creative-development/ප්‍රකාශයට පත් කර ඇත.

පරිගණන සේවා මධ්‍යස්ථානය (CSC)

UCSC උපදේශන අංශය වූ පරිගණන සේවා මධ්‍යස්ථානය තොරතුරු තාක්ෂණ හා සම්බන්ධිත ක්ෂේත්‍රවල උපදේශන සේවා, සැපයීම සඳහා 1990 දී පිහිටුවන ලදී.

CSC ක්‍රියාකාරකම් පහත දැක්වේ.

* කෙටිකාලීන පුහුණු පාඨමාලා
* මෘදුකාංග සංවර්ධනය
* උපදේශන සේවා

UCSC මඟින් පවත්වනු ලබන කෙටිකාලීන පුහුණු වැඩසටහන්

UCSC ක්ෂේත්‍රයේ ඉල්ලුමක් ඇති උසස් හා කාලීන වූ විශේෂිත, කෙටි කාලීන පුහුණු වැඩසටහන් පවත්වයි. මෙම වැඩ සටහන් සඳහා සහභාගිවන්නන් වැඩසටහන් භාෂාවක් ඉගෙනීමට, ක්‍රමවේද සැලසුම් කිරීමට, නව තාක්ෂණ හෝ විශේෂිත පැකේජයන් භාවිතා කිරීමට හැකිවීම අරමුණු කොට කුඩා කණ්ඩායම් වශයෙන්, සමීප අධීක්ෂණයකින් යුක්තව පැවැත්වේ.UCSC කාර්ය මණ්ඩලය විසින් සැලසුම් කෙරෙන මෙම පාඨමාලා කාර්මික අවශ්‍යතා හා ප්‍රමිතීන් අනුව සැලසුම් කෙරේ. මෙම වැඩ සටහන් බොහොමයක් දින 5 හෝ 10 ට වැඩිය.ඉල්ලීම පරිදි සමාගම්වල කණ්ඩායම්වලට විශේෂ වැඩ සටහන් පැවැත්වේ.

CSC මඟින් පවත්වන උපදේශන සේවා

CSC රජයේ හා පෞද්ගලික අංශ මෙම දෙකෙන්ම පහත සඳහන් උපදේශන සේවා පවත්වයි.

- ටෙන්ඩර් ඇගැයීම
- පද්ධති නිර්දේශය
- මෘදුකාංග ව්‍යාපෘති උපදේශනය
- ශක්‍යතා අධ්‍යයනය
- පරිගණන දෘඩකාංග හා මෘදුකාංග ප්‍රතිග්‍රහණ පරීක්ෂා
- බඳවා ගැනීම් පරීක්ෂණ සැලසුම් කිරීම හා පැවැත්වීම

බාහිර උපාධි මධ්‍යස්ථානය (EDC)

මහජනතාවට ප්‍රතිඵලදායී හා කාර්යක්ෂමව සේවාවක් සැපයීමට හැකි පරිදි UCSC බාහිර හා විස්තාරික පාඨමාලා කළමනාකාරිත්වය සඳහා බාහිර උපාධි මධ්‍යස්ථාන (EDC) පිහිටුවන ලදි.කොළඹ විශ්ව විද්‍යාලයේ බාහිර උපාධි වැඩසටහන් වශයෙන් වූ තොරතුරු තාක්ෂණ උපාධිය (BIT) ද එම වැඩ සටහනට ලියාපදිංචි වීමට අවම සුදුසුකම් නොමැති ශිෂ්‍යයින් සඳහා ශිෂ්‍යත්ව සහායක් ලබාදීමට විස්තාරික වැඩ සටහනක් වශයෙන් තොරතුරු තාක්ෂණ පදනම (FIT) ද වර්තමානයේ EDC සම්බන්ධීකරණය කරයි.

EDC දැනට පිහිටියේ UCSC පරිශ්‍රයෙන් පිටත වන අතර එහි ලිපිනය අංක 17, ස්වර්ණ පාර, කොළඹ 06 (හැව්ලොක් සිටි ඉදිරිපස) වේ.මධ්‍යස්ථානයේ සම්බන්ධීකාරක මධ්‍යස්ථානයේ සමස්ථ කළමනාකාරිත්වය සිදු කරන අතර ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී ශිෂ්‍ය ලියාපදිංචියට පරිපාලන සහාය සපයයි.

2017 වර්ෂයේ EDC ක්‍රියාකාරකම්

නව BIT ශිෂ්‍යයන් (1500 ට වැඩි) ලියාපදිංචි කිරීම් වර්තමාන සිසුන් (3500 වැඩි) නැවත ලියාපදිංචි කිරීම, 2017 මැයි මාසය තුල සමාසික 1,3 හා 5 පරීක්ෂණ කළමණාකරණය (2000 වැඩි), තොරතුරු තාක්ෂණ ඩිප්ලොමා (DIT) ප්‍රදානෝත්සවයක් සංවිධානය ,BIT බාහිර උපාධි (25 කට වැඩි) උපාධි ප්‍රදානෝත්සවය , BIT සමාසික 2,4 හා 6 පරීක්ෂණ(ශිෂ්‍යයන් 2000 වැඩි) පැවැත්වීම.

BIT උපාධි වැඩසටහන් සම්බන්ධව ක්‍රියාකාරකම් ගණනාවක් EDC පවත්වයි. http://ucsc.cmb.ac.lk/academic-programmes/edc/වෙබ් අඩවියේ EDC පිළිබඳ තොරතුරු ප්‍රකාශනය කර පවත්වාගෙන යයි.

E- ඉගෙනුම් මධ්‍යස්ථානය (e LC)

E- ඉගෙනුම් මධ්‍යස්ථානය (e LC) කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණන අධ්‍යයනාංශයේ මධ්‍යස්ථා 6 කින් එකකි. එහි ප්‍රධාන අරමුණ වනුයේ e- ඉගෙනුම් භාවිතයන් ඒකාබද්ධ කිරීමෙන් ඉගැන්වීම් - ඉගෙනුම් ක්‍රියාවලිය සංඛ්‍යාක පරිනාමණය පහසු කිරීමයි. එය ප්‍රථම උපාධි, පශ්චාද් උපාධියේ හා බාහිර හා විස්තාරික උපාධි වැඩ සටහන් සඳහා UCSC සේවා මධ්‍යස්ථානයක් වුවද දේශීය හා ජාත්‍යන්තර සංවිධානවලට සේවා සැපයෙන ජාතික මධ්‍යස්ථානයක් බවට පසුගිය දශකයේ දී පත්විය. (www.e-learning.lk) e ඉගෙනුම් පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන කටයුතු කරන, කැපවූ කාර්ය මණ්ඩලයක් e LC සතුය.UCSC වෙනුවෙන් e - ඉගෙනුම් පැවරුම් සිදුකරදීමට e ඉගෙනුම් මධ්‍යස්ථානය කැමැත්තෙන් සිටී.

අරමුණු :

- UCSC හි විද්‍යුත් ඉගෙනුම් යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම.
- UCSC තුල අධ්‍යනයේ තත්ත්වය වර්ධනය සඳහා e ඉගෙනුම් පර්යේෂණ පැවැත්වීම සහ සංවර්ධනය සහ අධ්‍යාපනය ජනතාව වෙත විස්තාරණය
- උසස් තත්ත්වයෙන් යුතු ඉගෙනුම් පාඨමාලා සැකසීම සඳහා විද්‍යුත් අධ්‍යයන සංස්කෘතිය පැතිරවීම.
- උපාධි වැඩ සටහන් සඳහා නම්‍ය ඉගෙනුම් හැකියාවක් ලබාදීම.
- ඉගෙනුම කරන්නාවුන් සඳහා තොරතුරු, ඉගෙනුම් ක්‍රියාකාරකම් සහ අධ්‍යයන ද්‍රව්‍ය මාර්ගතව ලැබීමට සැලසීම.
- අධ්‍යයන ක්‍රියාවලි විෂ්ඨාංගිකරණය සහ එය උනන්දු කරවන කාර්යක්ෂමව හා අධ්‍යතන බවට පත් කිරීම.
- අනෙකුත් දේශීය විශ්ව විද්‍යාලයනට පහසුකම් සැලසීම මෙන්ම ජාත්‍යන්තර සහයෝගිතාව වර්ධනය

2017 වර්ෂයේ ක්‍රියාකාරකම්

1. "විදුපියස" (ucsc තත්සම මණ්ඩපය) තේමාව යටතේ පහත සඳහන් තත්සම ඉගෙනුම් පරිසරයක් පවත්වාගෙන යාම.

    - අභ්‍යන්තර ප්‍රථම උපාධි සඳහා

      http:// uglv.ucsc.cmb.ac.lk)

      (1000 සක්‍රීය සිසුන් පමණ)

    - බාහිර ප්‍රථම උපාධි සඳහා

      http:// uglv.bit.lk

      (700 සක්‍රීය සිසුන් පමණ)

    - පශ්චාද් උපාධි සිසුන් සඳහා http:// pglv.ucsc.cmb.ac.lk
      (700 සක්‍රීය සිසුන් සඳහා පමණ)

2. BIT උපාධි වැඩ සටහන සඳහා උසස් කරවන පාඨමාලා සඳහා e- පරීක්ෂා පැවැත්වීම (ශිෂ්‍යයින් 2000 වැඩි)

3. ව්‍යවසායකත්වය හඳුන්වාදීමේ පාඨමාලාව සඳහා මාර්ග ගත e- පරීක්ෂා පැවැත්වීම (සිසුන් 1000 වැඩි)

4. BIT සිසුන්ගෙන් අවසාන වසර ව්‍යාපෘති සඳහා විශේෂ VLE පැවැත්වීම. (http:/vle.bit.lk/projects)

5. BIT උපාධි වැඩසටහනට විකල්ප සුදුසුකම් මඟින් අයදුම් කිරීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් සඳහා පදනම් වැඩ සටහනක් වශයෙන් වූ “තොරතුරු තාක්ෂණ පදනම” (FIT) මාර්ගගත ඉගෙනුම් වැඩසටහන කළමනාකරණය කෙරිණි. (http:/tit.bit.lk/vle)

6 VLE වල වූ මාර්ගගත පාඨමාලා සඳහා ඉගැන්වීම්, ඉගෙනුම් හා ඇගැයීම් සඳහා අන්තර් ක්‍රියාකාරී අන්තර්ගතයන් සංවර්ධනය කිරීම.

7. BIT හා FIT මාර්ගගත පාඨමාලා සඳහා e -පහසුකම් ලෙසද හැඳින්වෙන මාර්ගගත උපදේශ සැපයීම

8 රාජ්‍ය හා පෞද්ගලික සංවිධානවලට (KPMG) කොළඹ විශ්වවිද්‍යාලය මාර්ගගත තෝරාගැනීම් හා බඳවා ගැනීම් පරීක්ෂණ පැවැත්වීම)

9. නිදහස් හා විවෘත අධ්‍යයන සඳහා මාර්ගගත ඉගෙනුම් ද්වාරයක් පවත්වාගෙනයාම.

10. කොළඹ විශ්ව විද්‍යාලයේ ස්ථීර අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා UNESCO ඉගෙනුම් ව්‍යාපෘතිය සහයෝගිතාවයෙන් හැකියා සංවර්ධන වැඩ සටහනක් වශයෙන් මිශ්‍රිත ඉගෙනුම් වැඩ මුළුවක් පැවැත්විය.

වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය (PDC)

UCSC වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය පිහිටුවන ලද්දේ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ සමීප සම්බන්ධතාවක් පවත්වා ගැනීමට හා කර්මාන්ත හවුල් කාරකත්වය මගින් අධ්‍යයන වැඩ සටහන් වැඩි දියුණු කිරීමටය. PDC මූලික වශයෙන් යොමු වන්නේ වෘත්තිය කාර්ය මණ්ඩලයේ හා අභ්‍යන්තර සිසුන්ගේ නිපුණතා වැඩි දියුණු කිරීමට, කර්මාන්ත ස්ථාපනය හා අභ්‍යන්තර ප්‍රථම උපාධි අපේක්ෂකයින් ගේ යොමුවීම සහ අන්තර් සංස්කෘතික සුහදතාව වර්ධනයටයි. UCSC වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය (PDC) මෙහෙවර වනුයේ වෘත්තීය නිපුණතා, ව්‍යාපාර නිපුණතා,සන්නිවේදන නිපුණතා ,ප්‍රජා සේවා නිපුණතා,නවෝත්පාදන හැකියා හා ව්‍යවසායකත්වය වැනි බාහිර ක්‍රියාකාරකම් නිපුණතා සහිත පරිගණක උපාධිධාරීන් බිහි කිරීමටත් සාර්ථක වෘත්තිකයින් බවට පත්කර එවැන්නන් ශ්‍රී ලංකාවේ සමාජී ආර්ථික සංවර්ධනයට දායකත්වයක් ලබාදීමයි.

2017 වර්ෂයේ ක්‍රියාකාරකම්

* සමාගම් 70 ක උපාධි අපේක්ෂක ශිෂ්‍යයින් 240 ස්ථාපනය

* අවසන් වර සිසුන් සඳහා කර්මාන්ත නියෝජිතයින් සහයෙන් පෙරහුරු පරීක්ෂණ සංවිධානය

* කර්මාන්ත සහභාගිත්වයෙන් කර්මාන්ත ස්ථාපන ඇගැයීම් සැසියක් පැවැත්වීම

* වාර්ෂික උපාධි ප්‍රදානෝත්සවය සඳහා 2017 හොඳම ස්ථාපනය තෝරාගැනීමට ශිෂ්‍යයින් හා ස්ථාපනය ඇගැයීම සංවිධානය කිරීම.

2017 ප්‍රථම භාගයේදී පහත සඳහන් මාතෘකා යටතේ පහත සඳහන් සමාගම් වලින් සිසුන්ගේ Tech Talks සංවිධානය කිරීම


99 X Technologies (Ionic 2මගින් ඇප්ස් සැකසීම), Virtusa (තාක්ෂණ භාවිතයන්), WS0 2 ,කර්මාන්ත නැඹුරුව-DevOps, Brandix(ව්‍යාපාර බුද්ධි), Hsenid mobile Solotion (ආතති කළමනාකාරිත්ව හා නැගී එන තාක්ෂණ,Sysco Labs (නැගී එන තාක්ෂණ),Orange HRMm (නැගී එන තාක්ෂණ-Docker virtualization),IFS(මෘදුකාංග කර්මාන්තයේ නව නැඹුරුතාවක් හා කාල කළමනාකරණය),Millennium IT(කර්මාන්තයේ විශේෂ ක්ෂේත්‍ර),Crowderia විෂයානුබද්ධ කථා පදනම් වූ සාමාන්‍ය මාතෘකා)

සංඛ්‍යාක අධිකරණ මධ්‍යස්ථානය (CDF)

සංඛ්‍යාක අධිකරණ ක්‍රියාකාරකම් සහිත නීතිය හා නියෝග ආයතන මගින් UCSC වෙත සහාය සඳහා ලද ඉල්ලීම් මත විශේෂ ප්‍රකාශයකින් කල UCSC ආඥා පණතේ වෙනස් කිරීමකින් 2011 දී සංඛ්‍යාක අධිකරණ මධ්‍යස්ථානය (DFC) පිහිටුවන ලදි. පසුගිය වසර 15 තුල රට තුල නියමාකාර යාන්ත්‍රණයක් නොමැතිවීමෙන් මෙම ආයතන UCSC වෙතින් විමර්ශණ සඳහා ඉල්ලුම් කලහ. විශාල අපහසුතාවයන් මැද මේ ආයතන සඳහා UCSC සහාය දේ. මෙම සේවා ඉල්ලුම් කරන ප්‍රධාන ආයතන වනුයේ විවිධ උසාවි, අපරාධ විමර්ශණ දෙපාර්තමේන්තුව හා ත්‍රස්ත විමර්ශණ දෙපාර්තමේන්තුව හා ත්‍රස්ත විමරශණ දෙපාර්තමේන්තුවය.

ඩිජිටල් අපරාධ ක්‍රියාකාරකම් වල සාක්ෂි සෙවීම සංවේදී මෙන්ම පර්යේෂණ හා සංවර්ධන ප්‍රවේශයක් අවශ්‍ය අපහසු ක්‍රියාවලියකි. මෙම විමර්ශණ පැවැත්වීම සඳහා පසුගිය කාලයේ සහායක මෙවලම් කිහිපයක් UCSC අධ්‍යයන හා අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය සංවර්ධනය කල අතර සමහරක් ජාත්‍යන්තර සම්මන්ත්‍රණවලදී ප්‍රකාශයට පත්විය. (es .e.Asia 2009, සයිබර් අපරාධ, අධිකරණ අධ්‍යාපන හා පුහුණු 3 වන අන්තර්ජාතික සම්මන්ත්‍රණය, කැන්ටබරි විශ්ව විද්‍යාලය, එරා 2010)

පසුගිය දශක දෙකේදී විවිධ නීති ආයතනවලින් ඉල්ලුම් 500 කට වඩා UCSC වෙත ලැබුණද සංකීර්ණතාවයක්, අරමුදල් සහ යටිතල පහසුකම් හිඟතාවයක් මත අවශ්‍ය සහාය සැපයීමට ඉතා අපහසු විය. මෙම ක්‍රියාකාරී කටයුතු සඳහා රජයේ රස පරීක්ෂණ දෙපාර්තමේන්තුව ව්‍යාප්ත කිරීමට සහ අධිකරණ විමර්ශණ දෙපාර්තමේන්තුවේ වෙනම ඒකක පිහිටුවීම සඳහාත් UCSC රජයට සහාය ලබාදෙන ලදි



අධ්‍යාපනය

2. අධ්‍යාපනය

කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක අධ්‍යාපන ආයතනයේ (UCSC)හි සංයුක්ත සැලැස්ම අනුව සංවිධානයේ ප්‍රධාන වගකීම වනුයේ කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණන අධ්‍යාපනය ප්‍රවර්ධනයය කිරීමයි.එබැවින් UCSCවිසින් ප්‍රථම උපාධි වැඩසටහන් (අභ්‍යන්තර),සහ බාහිර හෝ විස්තාරිත වැඩසහන්වලට අදාළව පරිගණක අධ්‍යාපනය කළමනාකරණය කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල තුන (පෙර විස්තර කර ඇති පරිදි)මෙම අධ්‍යයන වැඩසටහන් ක්‍රියාවලිය කළමනාකරණය කිරීමේ වගකීම දරයි.

2.1 ප්‍රථම උපාධි අධ්‍යාපනය

කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යාපීඨය මගින් පිරිනමන පාඨමාලාවන්හි අංගයක් වශයෙන් පරිගණන අධ්‍යාපනය ප්‍රථම උපාධි මට්ටමෙන් ප්‍රථම වරට හඳුන්වාදෙනු ලැබුවේ 1967 පෙරය . කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක පීඨය වන UCSC, දැනුදු විද්‍යා පීඨය සඳහා පාඨමාලා පිරිනමන අතර එම පීඨයේ සිසුහු 1060 දෙනෙක් UCSC මගින් පවත්වනු ලබන පාඨමාලා හැදෑරීය. කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක උපාධි වැඩසටහන් ආරම්භ කරන ලද්දේ 1990 වසරේ දි විද්‍යා පීඨය යටතේ වන නමුත් UCSC ස්ථාපනය කිරීමෙන් අනතුරුව පරිගණන ප්‍රථම උපාධිය UCSC හි ප්‍රමුඛ වගකීම බවට පත්විය. 2017 වසරේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තෝරා ගනු ලැබූ සිසුහු 261 දෙනෙක් සඳහා පරිගණක විද්‍යා (CS) උපාධිය,තොරතුරු පද්ධති(IS) උපාධිය සහ මෘදුකාංග ඉංජිනේරු(SE) උපාධිය යනාදී පාඨමාලා හැදෑරීමට අවස්ථාව සලසා දෙන ලදී.

2.1.1 අභ්‍යන්තර ප්‍රථම උපාධි වැඩසටහන්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් ප්‍රකාශිත SLQF 5 වන හා 6 වන මට්ටම් දෙකම සැලකිල්ලට ගනිමින් පරිගණක විද්‍යා,මෘදුකාංග ඉංජිනේරු හා තොරතුරු පද්ධති යනාදියනට අදාළ මූලික උපාධි පාඨමාලා 5 ක් UCSC මගින් වර්තමානයේ දී පිරිනමනු ලබයි.මෙම වැඩසටහන්වල විෂයමාලා පරිගණන උපාධි සඳහා IEEE/ACM අන්තර්ජාතික මාර්ගෝපදේශන පදනම් කර සැලසුම් කොට සංවර්ධනයකර ඇත. UCSC මගින් එයින් පිටවන උපාධිධාරීන්ගේ රැකියා අනුපාතය 90% ඉක්මවා පවත්වාගෙන යාම සඳහා එහි පරිගණක උපාධි සියල්ලෙහිම උචිතත්වය වැඩිදියුණු කිරීම සඳහා දේශීය කර්මාන්තයන්ගේ ප්‍රතිපෝෂණය ලබා ගැනීම පිණිස අධ්‍යාපන-කර්මාන්ත උපදේශන මණ්ඩලයක් පිහිටුවන ලදී. එසේ බදවාගැනීම් අදාළව එම උපාධි පාඨමාලා 5 පහත හඳුන්වා දී තිබේ.

වගුව: 2.1.1 -අ: UCSC හි ප්‍රථම උපාධි අපේක්ෂක ගහණ ව්‍යාප්තිය

උපාධි වැඩසටහන	කාල සීමාව (අධ්‍යයන වර්ෂ)	SLQF මට්ටම
පරිගණක විද්‍යා විද්‍යාවේදී උපාධිය (බී එස් සී ,පරිගණක විද්‍යා , (CS)	වසර 3	5 වන මට්ටම
පරිගණක විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධිය (බී එස් සී මෘදුකාංග ඉංජිනේරු ගෞරව(පරිගණක විද්‍යා) (CS)	වසර4	6වන මට්ටම
මෘදුකාංග ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය (බී එස් සී ගෞරව(මෘදුකාංග ඉංජිනේරු,SE))	වසර4	6වන මට්ටම
තොරතුරුපද්ධතිපිළිබඳවිද්‍යාවේදීඋපාධිය (බී එස් සී (තොරතුරු පද්ධති,IS))	වසර3	5වන මට්ටම
තොරතුරුපද්ධතිවිද්‍යාවේදී ගෞරව උපාධිය (බී එස් සී තොරතුරු පද්ධති ගෞරව (තොරතුරු පද්ධති)(IS)	වසර 4	6වන මට්ටම

සිවු වසරක උපාධි වැඩසටහන සඳහා සිසුන් තොරාගනු ලබනුයේ ප්‍රථම වසර දෙක තුළ සිසුන්ගේ කාර්ය සාධනය පදනම් කර ගනිමිනි.GPA අගය2.75 ට වඩා වැඩි සිසුහු ගෞරව උපාධිය සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලැබූ නමුත් වර්තමානයේ දී පරිගණක විද්‍යාව සඳහා ඇතුළත් කර ගැනීමට හැකියාව ඇත්තේ 40 දෙනෙක්ද තොරතුරු පද්ධති සඳහා 20 දෙනෙක් ද පමණි.පරිගණක විද්‍යා සිසුන්ට පරිගණක විද්‍යා හෝ පද්ධති ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධි

තෝරාගැනීමට අවස්ථාව ලබාදෙන ලදී. පලවන වසර දෙකෙහි විභාල ප්‍රතිඵල තෙවන වර්ෂයේ පළමු සමාසිකය ආරම්භ කිරීමට පෙර නිකුත් කරනු ලැබීය.සියලුම උපාධි වැඩසටහන් සඳහා සංශෝධිත විෂයමාලා දැන් ක්‍රියාත්මකව පවතියි. අධ්‍යයන පොදු සහතික පත්‍ර(උසස් පෙළ)විභාගයේ දී සංයුක්ත ගණිතය හෝ භෞතික විද්‍යාව හෝ උසස් ගණිතය යන විෂයයන්ට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් (C) ද සංයුක්ත ගණිතය, උසස් ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හෝ ගණිතය යනාදි විෂයයන්ගෙන් දෙකක් සඳහා අවම වශයෙන් සාමාර්ථයක්(S) ලැබූ සිසුහු UCSC හි පරිගණක විද්‍යා විෂය ධාරාව සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබති.2017 වසරේ අප්‍රේල් මාසයේ දී තොරතුරු පද්ධති උපාධි වැඩසටහන සඳහා තෝරාගැනීමේ පරීක්ෂණයක් (අභියෝග්‍යතා පරීක්ෂණයක්) පවත්වන ලදුව ඒ සඳහා ඉල්ලුම් කළ අපේක්ෂකයන් 2270 ක් වූ අතර321 ක් (IS) විෂය ධාරාව හැදෑරීමට සුදුසුකම් ලැබූහ.උපාධි වැඩසටහන සඳහා ලියාපදිංචි වූ තත්‍ය ශිෂ්‍ය සංඛ්‍යාව පහත දැක්වේ.

2.1.2 2016/2017-අධ්‍යයන වර්ෂය සහ ශිෂ්‍ය බඳවා ගැනීම

වගුව 2.1.2–ඇ: බඳවා ගැනීම - UCSCහි ඇතුළුවීම බෙදීයාම - 2017

අධ්‍යයන විෂය ධාරාව	ඇතුළත් කර ගත් සංඛ්‍යාව	බඳවා ගත් සංඛ්‍යාව	පුරුෂ	ස්ත්‍රී
පරිගණක විද්‍යා විෂය ධාරාව(CS)	175	163 (93%)	105 (64%)	58 (36%)
තොරතුරු පද්ධති විෂය ධාරාව (IS)	100	98 (98%)	32 (33%)	66 (67%)
එකතුව	**275**	**261 (95%)**	**137 (52%)**	**124 (48%)**

අධ්‍යයන වර්ෂයක් සාමාන්‍යයෙන් සමාසිකය දෙකකින් සමන්විත වන අතර එක් එක් සමාසිකය ට සති 15 ක් ඇතළත් වෙයි. සමාසිකය මධ්‍ය නිවාඩු කාලය සතියක් වන අතර සමාසිකය අවසානයේ පරීක්ෂණ ආරම්භ කිරීමට ප්‍රථම සතියක නිවාඩුවක් ලබා දෙනු ඇත.2017 අධ්‍යයන වර්ෂය සඳහා දිනදර්ශනය පහත දැක්වේ. UCSC සඳහා තෝරාගත් නව උපාධි අපේක්ෂකයන් පිළිගැනීමේ සමාරම්භක උළෙල 2017 වසරේ ජනවාරි 11 වැනි දින පවත්වන ලද අතර නම්නීකරණය වැඩසටහන අධ්‍යයන වර්ෂය ආරම්භ කිරීමට පෙර 2017 ජනවාරි 16 සිට 27 දක්වා පැවැත්විණ.

2017 වසර සඳහා අධ්‍යයන කාල සටහන

කාලසීමාව		සති	11/12	12/13	13/14	14/15	15/16
9/5/2016	10/16/2016	6	4S2	3S2	2S2	1S2	**+1 ***
10/17/2016	10/23/2016	1	මධ්‍ය වර්ෂාර්ධ නිවාඩුව				
10/24/2016	12/11/2016	7	4S2	3S2	2S2	1S2	**+1 ***
12/12/2016	12/18/2016	1	අධ්‍යයන නිවාඩු				
12/19/2016	1/15/2017	4		2වන වර්ෂාර්ධ පරීක්ෂණය			
1/16/2017	1/29/2017	2		පලවන වසර නම්නීකරණය වැඩ සටහන (පලවන සති 2) සහ නිවාඩුව(ජෙෂ්ඨයින් සඳහා පමණි)			
1/30/2017	2/12/2017	2		සියලමු UCSC සිසුන් සඳහා නිවාඩු කාලය / උත්තර පත්‍ර පරීක්ෂාව			
2/13/2017	4/9/2017	8		4S1	3S1	2S1	1S1
4/10/2017	4/16/2017	1		අලුත් අවුරුදු නිවාඩුව			
4/17/2017	6/11/2017	8		4S1	3S1	2S1	1S1
6/12/2017	6/18/2017	1		අධ්‍යයන නිවාඩු			
6/19/2017	7/16/2017	4		**පළමු වන වර්ෂාර්ධ පරීක්ෂණය**			
7/17/2017	7/30/2017	2		ශිෂ්‍ය නිවාඩු/යඋත්තර පත්‍ර පරීක්ෂාව සහ /ව්‍යාපෘති ඇගයීම්			
7/31/2017	9/3/2017	5		4S2	3S2	2S2	1S2
9/4/2017	9/10/2017	1		වර්ෂාර්ධ මධ්‍ය නිවාඩුව			
9/11/2017	11/5/2017	8		4S2	3S2	2S2	1S2
11/6/2017	11/12/2017	1		අධ්‍යයන නිවාඩු			
11/13/2017	12/10/2017	4		2වන වර්ෂාර්ධ පරීක්ෂණය			
12/11/2017	1/21/2018	6		නත්තල් සහ නව අවුරුදු නිවාඩුව			
1/22/2018	3/11/2018	7		නව අධ්‍යන වර්ෂය ආරම්භය			

කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදල	758,000	2,427,626
JICA සම්මාන අරමුදල	164,928	164,928
ටී.එච්.ඒ.ද සුසා සම්මානය	200,000	200,000
උපකරණ ප්‍රතිස්ථාපන අරමුදල	2,318,411	978,477
සම්බන්ධීකාරක /කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදල	131,003	131,003
චර්තුසා අධ්‍යයන විශිෂ්ඨතා	258,716	206,057
ෂෙඔරියා රොබස්ට්‍රා ශිෂ්‍යත්ව - 1	583,296	532,444
ෂෙඔරියා රොබස්ට්‍රා ශිෂ්‍යත්ව - 11	590,179	534,567
ශිෂ්‍ය පොදු ශිෂ්‍යත්ව අරමුදල - කර්මාන්ත	40,000	-
ශිෂ්‍යයින්ගේ ආපදා අරමුදල	6,236,694	5,769,995
මහපොල	1,563,650	4,961,300
මූල්‍යාධාර අරමුදල	181,600	609,850
හොඳම කාර්ය සාධන සම්මානය - මෝටරෝලා	150,477	140,727
හොඳම කාර්ය සාධන සම්මානය -IFS	509,830	140,130
හොඳම කාර්ය සාධන සම්මානය - සම්පත් බැංකුව	158,275	147,775
මහාචාර්ය මොහාන් මුණසිංහ සම්මානය -1	64,292	58,874
මහාචාර්ය මොහාන් මුණසිංහ සම්මානය -2	58,212	52,982
CINTEC සම්මානය හොඳම F/Y ව්‍යාපෘතිය	111,452	101,764
ඩේවිඩ් පීරිස් පදක්කම් හොඳම - කර්මාන්ත	654,390	597,508
එල්.එන්.ඩී.සිල්වා පර්යේෂණ ප්‍රදාන	72,030	72,030
එම්.සෝමා ගුණතිලක සිහිකිරීමේ සම්මානය	208,679	-
එම්.විමලා ජයරත්න සිහිකිරීමේ සම්මානය	210,427	-
යටිතල පහසුකම් සංවර්ධන අරමුදල	-	34,129,125
ගිවිසුම් වටිනාකම් අයකර ගැනීම් ගිණුම	11,169,004	11,305,846
මුළු	**184,449,217**	**210,335,449**

6.7 විගණන වාර්තාව



විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT



මගේ අංකය / எனது இல. / My No. } එජරිඩි/සී/යුපිඩප්ස් /6/17/02 | වෙනි අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2018 සැප්තැම්බර් 18 දින

අධ්‍යක්ෂ

කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2002 අංක 01 දරන කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතන නියෝගවලින්ය් 23 වගන්තිය හා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

යතාර්ත්ත වාර්තාව මේ සමග එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති (වැඩබලන)

පිටපත් -

1. ලේකම් , උසස් අධ්‍යාපන හා සාස්කෘතික කටයුතු අමාත්‍යාංශය
2. ලේකම් , මූල්‍ය හා ක්‍රියාන්විය අමාත්‍යාංශය
3. සභාපති , විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. උපකුලපති , කොළඹ විශ්වවිද්‍යාලය

අංක 306/72, පොළොන්නරු පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொலன்னறுவை வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } දෙවි/සී/යුඩිඑස්සී /6/17/02 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018 සැප්තැම්බර් 18 දින

අධ්‍යක්ෂ

කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනයේ **2017** දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව **2002** අංක **01** දරන කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතන නියෝගවලියේ 23 වගන්තිය හා **1978** අංක **16** දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මිටිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා ඊට අදාළ සිදුණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ සටහන්වලින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 2002 අංක 01 දරන කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතන නියෝගවලියේ 23 වගන්තිය යටතේ සංගයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වාවස්ථාවේ අනුලක්ෂ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු බැවි මා අදහස් කරන මාගේ මතය දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය ණය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් පැහිරිය හැකි ද්‍රව්‍යමය සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

No. 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. . இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்ல, இலங்கை. · No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

1.3 විගණනයේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ යුක්තිසහ සාධාරණ සාක්ෂියක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රතිඵල අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථානෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ දැනුම ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණන සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීතාවය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණකාධිපති විෂය පථය සහ ප්‍රවාණය නිර්ණය කිරීම සඳහා 1978 අංක 16 දරන විගණකාධිපති පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති මෙම ගණිමහනුසාර කළයුතු පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීමේ උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තක්සේරුකරණය කළ මතය සඳහා පදනම

ඉවත වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්කරුණුකරණය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාරූපණය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූලා ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය ණය ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට පටහැනි පදනම් වගවීමකාරිත්ව ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නෑ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ හිටපු ලේකම් අමතක මාණ්ඩලයේ අනුමැතියකින් තොරව 2006 දෙසැම්බර් 29 දින පරිගණක අධ්‍යයන ආයතනය තුළ ඇපයෙන් තීමත කළ සමාගමක් ලෙස ගිණුම්ගත නිෂ්ක්‍රීය සමාගම් ස්ථාපිත කර 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර තිබුණි. 2009 මාර්තු 02 දින එය නැවතත් 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර තිබුණි.

තීමත නිෂ්ක්‍රීය සමාගම් වෙනම නීතිමය ඒකකයක් ලෙස ස්ථාපිත කර තිබුණද පරිගණක අධ්‍යයන ආයතනයේ සම්පත් භාවිතා කරමින් ආයතන පරිශ්‍රය තුළ කටයුතු කරගෙන යනු ලැබේ. සමාගම්වල වාවෙස්ථාවලියේ 32 වන වගන්තිය අනුව එම සමාගමේ භාණ්ඩාගාරික මණ්ඩලයට කොළඹ විශ්වවිද්‍යාල පරිගණක අධ්‍යයන ආයතනයේ නිලධාරීන් නිලබලයෙන් පත්විය යුතු බව දැක්වෙන නමුත් ඒ අනුව තීමත නිෂ්ක්‍රීය සමාගම්, පරිගණක අධ්‍යයන ආයතනයෙහි පූර්ණ පාලන බලය යටතේ පවතින පරිපාලිත සමාගමකි. ඒ අනුව පරිගණක අධ්‍යයන ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තීමත නිෂ්ක්‍රීය සමාගම්වල මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධකර වීනාශිද්ධ ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. කෙසේ වුවද, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාළව පරිගණක අධ්‍යයන ආයතනයේ මූල්‍ය ප්‍රකාශන නිෂ්ක්‍රීය සමාගම්වල මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කර ඉදිරිපත් කර තිබුණි.

2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම

පරාවර්ත වත්කම් ලේඛනයෙහි ඇතුළත් වත්කම් වර්ග 07 කට අදාළ පිරිවැය එකතුව රු.1,025,723,966 ක් වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව එම වත්කම්වල පිරිවැය රු. 1,024,178,700 ක් වූයෙන් රු. 1,545,266 ක පැහැදිලි නොකළ වෙනසක් පවතිනු ණි.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ශිෂ්‍යාම

වර්ෂ අවසානයට වැඩි කාලයක් ගිය ද ඉතිරිව පවතින ණය ශේෂය රු.1,457,792 ක් වන්නා සැපයුම්කරු අංක 41 ණ ඇස රු.11,200 ක උත්සව අත්තිකාරම් ශේෂය 09 ක වර්ෂ 03 සිට වර්ෂ 10 දක්වා වූ කාලයක් තුළ ගෙවීමේ පැවති සහ එවැනි ණය ශේෂ ඒ සඳහා ගැනීමට ප්‍රතිපාදන සලසා ගැනීමට කිසිදු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම
(අ) 2016 ජනවාරි 01 දිනැති අංක 01/2016 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වක්‍රලේඛය	බාහිර පාඨමාලාවන් සඳහා සවන්වනු ලබන විනාඩි කථානුවලදී ගෙවිය යුතු උපරිම සීමාවන් වක්‍රලේඛයේ දක්වා තිබුණද එම සීමාවන් ඉක්මවා සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් වෙත රු.166,375 ක් ගෙවා තිබූ අතර වක්‍රලේඛයේ සීමාවන් ඉක්මවා ගෙවීම් කිරීම අභ්‍යන්තර විගණනයේදී නිරීක්ෂණය විය.
(ආ) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන මූදල් වක්‍රලේඛයේ (iv) ඡේදය.	අත්තිකාරම් කාර්යය නිමකළ වහාම එම අත්තිකාරම් වියදම ශුද්ධ වූවාත්, අවධාරණ 11 කදී ලබාදී නිසි එකතු වටිනාකම රු.347,000 ක් වූ අත්තිකාරම් මූදල් වියදමේ ප්‍රතිඵලයක් නිරීක්ෂණය වූ අතර ප්‍රමාද වූ කාලය දින 33 සිට දින 169 දක්වා විය.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනය අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.28,844,440 ක අතිරික්තයක් වූ අතර, ඊට අදාළව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.24,205,857 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,638,583 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී උපාධි පාඨමාලා කුලින් රු. 25,378,916 ක ලාභාංශයක් ලබා තිබුණ ද බාහිර පාඨමාලා මගින් රු. 34,436,009 ක අතිරික්තයක් ලබා තිබීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය පත ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ පැවති රු.75,145,031 ක අතිරික්තය 2017 වර්ෂය වන විට රු.28,844,440 ක් දක්වා අඩු වී තිබුණු අතර මෙම කාල සීමාව තුළ මූල්‍ය ප්‍රතිඵලයෙහි සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය විය. එසේමත් වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ක්ෂය වීම් සහ රජයට ගෙවූ බදු නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේදී රු.180,507,872 ක්වූ ආයතනයේ දායකත්වය 2014 වර්ෂයේදී රු.155,717,099 ක් දක්වා අඩු වී ගිය නමුත් 2015 වර්ෂයේ සිට අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.247,737,952 ක් වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

4.1.1 පැලැස්ම් කිරීම

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම් මිළිගෙයල කිරීමේදී ප්‍රධාන අරමුණු පදනම් කරගෙන මිළිගෙයල කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය තුළ ඉටුකිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් සඳහා වැයවිය යුතු පරිමාණ දක්වා තිබුණි. කවද, කාර්යසාධන දර්ශක දක්වා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට මිළිගෙයල කර තිබුණු ප්‍රගති වාර්තාව මගින් මූල්‍ය හෝ කාර්යසාධන ප්‍රගතිය ඇගයීමට නොහැකි විය.

4.1.2 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ ක්‍රියාකාරකම් 26 ක් ඉටු කිරීමට අපොහොසත් වී තිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරුණු වැනේ.

(අ) ආයතනයේ අභ්‍යන්තර උපාධි පාඨමාලා සඳහා ඇදුරු හන්නා සිසුන්ට ශෝධනාගාර පහසුකම් සැපයීම සඳහා 2010 සහ 2014 වර්ෂවලදී කුලී පදනම් මත ශෝධනාගාර ලබාගෙන තිබුණි. මේ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.1,912,800 ක් වැලි වලය රහිත තිබූ අතර ස්ථිර ශෝධනාගාර පහසුකම් ලබාගැනීම සඳහා යුදුසු වැඩ පිළිවෙලක් සකස් කිරීමට කළමනාකාරීත්වයේ අවධානය යොමුකළ යුතු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) ආචාර්යවරයෙකුගේ පරිවාස කාලය 2014 අගෝස්තු 03 දිනෙන් ඇරඹී තිබූ නමුත් පරිවාස කාලය තුල සම්පූර්ණ කළ යුතු Certificate for Teaching in Higher Education යන පාඨමාලාව 2018 අප්‍රේල් 27 දින දක්වාම සම්පූර්ණ කර නොතිබිණි. එසේම ඊට්ට, පරිවාස කාලය දීර්ඝ කිරීමකින් තොරව එම ආචාර්යවරයා වෙත වැටුප් රහිත අධ්‍යයන නිවාඩු ලබාදීමට කොළඹ විශ්වවිද්‍යාලයේ නිවාඩු සහ සම්මාන කමිටුව (Leave and Awards Committee) 2017 ඔක්තෝම්බර් 30 දින තීරණය කර තිබුණි.

(ඇ) ගිවිසුම් කඩ කළ ආචාර්යවරුන් සිංහලොකුගෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට අයකර ගත යුතු මුදල රු.2,032,948 ක් වූ අතර ඉන් ආචාර්යවරුන් දෙදෙනෙකුගෙන් කිසිදු මුදලක් සම්පාලෝචිත වර්ෂය තුළ අය කර ගෙන නොතිබිණි.

4.3 කාර්යසාධන පරීක්ෂණය

ආයතනයේ අභ්‍යන්තර කාර්ය මණ්ඩලයෙහි පුරප්පාඩු 127 ක් පැවති අතර මෙන්ම්න් පදනම් මත සේවකයින් 25 දෙනෙකු ද දෛනික ගෙවීමේ පදනම් මත හා කාර්ය පැවරුම් පදනම් මත සේවකයින් 43 දෙනෙකු වෙත වේවා දිගු දැනුම්දීමක් නවතුරුවන් සේවයේ යොදවා තිබුණි. එමෙන් 2015 සහ 2016 වර්ෂයන්හිදී පුරප්පාඩු පැවති අතර සේවකයන් බඳවාගැනීමේ කාර්යයෙහි පුරෝගයන් පැවතුණි.

5. නිරසාර සංවර්ධනය

5.1 නිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීම

2017 අගෝස්තු 14 දිනැති ෆෝක එස්පී/එස්පී/එස්ඩීජී/17 දරන රාජිත ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය හා නිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "නායක පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු වුවන් පමාලෙන්විත වර්ෂයට අදාළව ආයතනය විසින් තම විෂයය පථය තුළට ගැනෙහ කාර්යයන් සම්බන්ධයෙන් කෙතෙක් ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබීම.

ඊ සඳහාවෙන් තම විෂය පථයට වැටෙන කාර්යයන් සම්බන්ධයෙන් නිරසාර සංවර්ධන ඉලක්ක, ඉලක්ක හා ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක වෙත ප්‍රගතිය මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබීම.

6. මිණුම් කටයුතුභාවය සහ ගණපාලනය

6.1 අංශය ලේඛනමය පාලනය

2016 ජනවාරි 01 දිනැති අංක 01/2016 දරන චක්‍රලේඛය මගින් බැංකු උපාධි පාඨමාලා, බැංකු ආධ්‍යාපලා, බැංකු විභාග හා සම්බන්ධිත කාර්යයන් පිළිබිඳව ගෙවීම් සිදුකිරීමට මෙය පහසුවීමක් ලබාදී තිබියදීත් ඊට පටහැනි ලෙස නව පාඨමාලා සඳහා අයවැය ලේඛන පිළියෙල කර ඒ සඳහා මූල්‍ය කමිටු හා පාලක සභා අනුමැතිය ලබාදී තිබුණි.

6.2 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ අභ්‍යන්තර විගණනය කොළඹ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය වෙත පැවරී තිබුණද ප්‍රතිඵලවත් විගණනයක් සිදු නොවිය හේතුවෙන් 2011 අප්‍රේල් 01 දින ආයතනයේ විගණන කටයුතු පෞද්ගලික සමාගමක් වෙත පවරා නිබුණි. 2017 දෙසැම්බර් 31 දිනවන විට ප්‍රථම ෆර්ධ වර්ෂයට අදාළ විගණනය සම්පූර්ණ කිරීමට තිබූ අතර විගණන වැඩසටහනට අනුව ඉදිරිය වර්ෂයට අදාලව කිරීමට යුතු විගණනය සඳහා පාර්ශවයේ දින වන විටත් නියමිත නොතිබුණි.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූලික ආඥාපනත 134(3) ප්‍රකාරව ලොතරැයි විගණන වාර්තාවල සිටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

6.3. ප්‍රසම්පාදනයන්

2017 වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්මේ අන්තර්ගත රු.මිලියන 18 ක් වටිනා ප්‍රසම්පාදනයන් 02 ක් සම්මන්ත්‍රණ වර්ෂයේදී ඉටුකර නොතිබූ අතර ප්‍රසම්පාදනයන් 04 ක් සඳහා ඇස්තමේන්තුගත වියදම රු. 3,538,574 ක වියදම් දරා තිබූ බව නිරීක්ෂණය විය.

6.4 නොවියදී ඇති විනෝදාංශ මේද

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය වියුන් සේවකයින් 05 දෙනෙකුට හා ආධාරයවරයින් සඳහන්කරනු ලබන ලබාදී තිබූ එකතුව රු.344,006 ක මෙවන මූල්‍ය ශුද්ධ වර්ෂ 05 සිට වර්ෂ 24 දක්වා කාලයක් තබාගෙන පැවතුණි.

(ආ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත ප්‍රකාරව විශ්වවිද්‍යාල, මණ්ඩල හා විවෘත විශ්වවිද්‍යාල නියෝගයන්ම බැහැර ගමුගෙහි පළකරනු ලැබිය යුතුය අතර ඉන් අනතුරුව එය ශ්‍රීජයවර්ධනපුර හා අසල්වැසි හැකිනෙක් ඉන්ජනීන් සංවර්ධනාංශයේ සහාගත කළ යුතුය. එහෙත් 2002 අංක 01 දරන කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතන නියෝගාවලිය 2002 නොවැම්බර් 15 දිනැති අංක 1262/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළකර නිසුණු මෙම වාර්තාව දින පහ විවෘත පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

(ඇ) පරිගණක අධ්‍යයන ආයතනයෙහි පරිපාලන හා අධ්‍යාපන කටයුතු සඳහා ඉදිකර තිබූ මහල් 05 කින් සමන්විත ගොඩනැගිලි සංකීර්ණය මිහිට ඉවත් කොළඹ විශ්වවිද්‍යාලය සතු වන අතර එම ඉඩමෙහි නීතානුකූල අයිතිය පවරා ගැනීමට මෙම වාර්තාවේ දින වනවිටත් කටයුතු කර නොතිබුණි.

07. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරෙන්වර ආයතනයේ ප්‍රධාන්ෂෙවරියාගේ අවධානයට යොමු කරන ලදී. ඒගණ සඳහන් සංලග්න ක්ෂේත්‍රයන් තෙකෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

	පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ)	ස්ථාවර වත්කම් පාලනය	වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොගැනීම.
(ආ)	පත්වක මණ්ඩල කළමනාකරණය	කාර්ය මණ්ඩල අවශ්‍යතා අනුව අනුමත කාර්ය මණ්ඩල ශාකෘත්වනය කිරීමට සහ පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු නොකිරීම.
(ඇ)	ප්‍රසම්පාදන ක්‍රියාවලිය	ප්‍රසම්පාදන සැලැස්මී අනුව ප්‍රසම්පාදන කටයුතු නොකිරීම
(ඈ)	අභ්‍යන්තර විගණනය	අභ්‍යන්තර විගණනය ප්‍රවාහද වීම.

ඩබ්ලිව.ඒ.ඒ.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

6.8 විගණන විමසුම සඳහා පිළිතුරු

6.8.1 නොසැසඳුන පාලන ගිණුම්

විගණන නිරීක්ෂණය	අප ආයතනය ගන්නා ලද ක්‍රියා මාර්ගය
(අ) ස්ථාවර වත්කම් ලේඛනයෙහි ඇතුළත් වත්කම් වර්ග 07 කට අදාළ වටිනාකමෙහි එකතුව රු. 1,025,723,966.00 ක් වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව එම වත්කම්වල එකතුව රු. 1,024,178,700.00 ක් වූයෙන් රු. 1,545,266.00 ක පැහැදිලි නොකළ වෙනසක් පැවතුණි.	මෙම වෙනසට හේතු මේ වන විට හඳුනා ගනිමින් සිටින අතර එයට අනුව එම නිවරදි කිරීමේ කටයුතු කරමින් පවතී.
(ආ) සමාලෝචිත වර්ෂය තුළ මිලදීගෙන තිබුණු ප්‍රාග්ධන අයිතම 03 ක වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයේ රු.86,665,44.00 ක් ලෙස දක්වා තිබූ අතර මූල්‍ය ප්‍රකාශනවල රු. 82,956,841.00 ක් ලෙස දක්වා තිබීමෙන් රු. 3,708,703.00 ක වෙනසක් පැවතුණි.	මෙම වෙනස මේ වන විට නිවරදි කර ඇති අතර ඉදිරියේ දී මෙවැනි වෙනස් කම් ඇති වීම වැලැක්වීම සඳහා ස්ථාවර වත්කම් ලේඛනය සහ ලෙජරය සැසඳීම සිදුකිරීමේ ක්‍රමවේදයක් හඳුන් වා දී ඇත.

6.8.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

විගණන නිරීක්ෂණය	අප ආයතනය ගන්නා ලද ක්‍රියා මාර්ගය
වර්ෂ දෙකකට වැඩි කාලයක සිට පැවත එන රු. 1,457,792.00 ක ණය ශේෂ 41 ක් අයකර ගැනීමට ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි.	මෙම ණය අය කර ගැනීම සම්බන්ධව ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ අවධානය යොමුකර ඇති අතර මේ පිළිබඳ විමර්ශනයක් සිදු කර ගතයුතු ක්‍රියා මාර්ග තීරණය කිරීම සඳහා සඳහා කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් 2018/09/06 දින පැවති 209 වැනි කළමණාකරන මණ්ඩල රැස්වීමේ දී පත්කරන ලදි. ඒ අනුව මෙම කමිටුව මෙම ණය ශේෂ සම්බන්ධව ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග කළමණාකරන මණ්ඩලය වෙත නිර්දේශ කර අදාල ණය මුදල් සම්බන්ධව ඉදිරිපියවර ගනිමින් පවතියි.තවද, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හරහා මෙම ණය මුදල් නිරාකරණය කරන ලෙස අදාල ආයතන වලින් ඉල්ලීම් කර ඇත.

6.8.3 නීති රීති රෙගුලාසි කළමනාකරණ හා තීරණවලට යොමුව

විගණන නිරීක්ෂණය	අප ආයතනය ගන්නා ලද ක්‍රියා මාර්ගය
(අ) 2016 ජනවාරි 01 දිනැති අංක 01/2016 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍ර ලේඛය **<u>අනුකූල නොවීම</u>** බාහිර පාඨමාලාවන් සඳහා පවත්වනු ලබන විභාග කටයුතුවලදී ගෙවිය යුතු උපරිම සීමාවන් චක්‍ර ලේඛයේ දක්වා තිබුණද එම සීමාවන් ඉක්මවා රු. 166, 375.00 ක මුදලක් ගෙවා තිබුණි.	තොරතුරු තාක්ෂණ බාහිර උපාධි පාඨමාලාව (BIT) 2000 වර්ෂයේ දී ආරම්භකරන ලද අතර එම පාඨමාලාවේ වාර්ෂිකව අය සහ වැය රේටයන් ආයතනයේ කළමනාකරණය විසින් ඇගයීමකට ලක්කර අවශ්‍ය සංශෝධනයන් සිදුකරනු ලබන්නේ එම පාඨමාලාවේ උන්නතිය (Sustainability) සැලකිල්ලට ගෙනය. විගණන විමසුමේ ගෙවීම් රේටයන් දැක්වෙන 01/2016 චක්‍ර ලේඛනය නිකුත් වූයේ 2016 වසරේ ජනවාරි මස වන අතර ඒ වන විටත් අප ආයතනය විසින් ගෙවීම් කරනු ලබූ රේටයන් චක්‍ර ලේඛනයේ දැක්වෙන රේටයන්ට වඩා වැඩි විය. ඉහත චක්‍ර ලේඛනය 2016 දී නිකුත් වුවද තොරතුරු තාක්ෂණ උපාධි පාඨමාලා සඳහා තරඟකාරී ආයතන මඟින් ගෙවනු ලබන රේටයන් චක්‍ර ලේඛනයේ සඳහන් රේටයන්ට වඩා බෙහෙවින් ඉහල අගයක පැවතීමත්, පාඨමාලාවේ තත්වය ඉහල මට්ටමක පවත්වා ගැනීම අවශ්‍ය නිසාත් ඉහත රේටයන් චක්‍ර ලේඛනයේ රේටයන් දක්වා අඩුකළ නොහැකි අතර මෙම පාඨමාලාවේ සියලු ගෙවීම් පාඨමාලාවේ ආදායමින් පමණක් සිදුකෙරෙන අතර සියළු ගෙවීම් පාඨමාලා අයවැය ලේඛනය අනුව සිදුකිරීමට කළමණාකරන මණ්ඩලය තීරණය කරන ලදි. මෙම ගැටලුව සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව දැනුවත් කර ඔවුන් ගේ උපදෙස් ලබා ගැනීමට කටයුතු කර ඇත.
(ආ) 2005 දෙසැම්බර් 19 දිනැති අංක පීඩීඊ/33 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛය **<u>අනුකූල නොවීම</u>** ආයතනය ඉපයූ ආදායමින් රු. 16,045,122.00 ක් භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව ආයෝජනය කර තිබුණි.	ආයෝජන සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීම සඳහා වන ඉල්ලීම මහා භාණ්ඩාගාරය වෙත යොමුකර ඇති අතර ඉදිරියට මෙම චක්‍ර ලේඛය ප්‍රකාරව කටයුතු කරමි.

6.8.4 මූල්‍ය ප්‍රතිඵලය

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු. 28,844, 440.00 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 24,205,857 ක් වූයෙන් ඉකුත්

වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 4,638,583 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව රජයෙන් ලැබුණු පුනරාවර්තන ප්‍රදානය රු. 7,862,031 කින් වැඩි වීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2013 වර්ෂයේ පැවති රු. 75,145,031 ක අතිරික්තය 2017 වර්ෂය වන විට. 28,844, 440 දක්වා අඩු වී තිබුණු අතර මෙම කාලසීමාව තුල මූල්‍ය ප්‍රතිඵලයෙහි සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය විය. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ක්ෂය වීම් සහ රජයට ගෙවූ බදු ගැලපීමෙන් පසු 2013 වර්ෂයේ දී රු. 180,507,872 ක් වූ ආයතනයේ දායකත්වය 2014 වර්ෂයේ දී රු. 155,717,099 ක් දක්වා අඩු වුවද 2015 වර්ෂයේ සිට අඛන්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේ දී රු. 247,737,952 වී තිබුණි.

6.8.5 කාර්ය සාධනය

විගණන නිරීක්ෂණය	අප ආයතනය ගන්නා ලද ක්‍රියා මාර්ගය
(අ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේ දී ප්‍රධාන අරමුණු පදනම් කරගෙන පිළියෙල කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ ඉටුකිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් සඳහා වැයවන මුදල පමණක් දක්වා තිබුණු අතර කාර්යසාධන දර්ශක දක්වා නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ අවසානයට පිළියෙලකර තිබුණු ප්‍රගති වාර්තාවෙහි මූල්‍ය ප්‍රගතිය පමණක් දක්වා තිබීමෙන් කාර්යසාධනයෙහි ප්‍රගතිය පරීක්ෂා කිරීමට නොහැකි විය.	2018 වර්ෂයේ සිට කාර්යසාධන දර්ශක ඇතුලත්ව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙලකර කර ඇත.
(ආ) ආයතනය විසින් ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව අනුව ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් ක්‍රියාකාරකම් 26 ක් ඉටු කිරීමට අපොහොසත් වී තිබූ බව මූල්‍ය ප්‍රගතිය “0” ලෙස ප්‍රගති වාර්තාවේ සඳහන් කර තිබීමෙන් නිරීක්ෂණය විය.	ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් ක්‍රියාකාරකම් ප්‍රතිශතයක් වශයෙන් ගත්කල 80% වර්ෂය තුල නිමකර ඇති අතර නිම කිරීමට නොහැකි වූ ක්‍රියාකාරකම් ප්‍රතිශතය 20% පමණි. ඒයට හේතුව සමාලෝචිත වර්ෂයේ ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීමයි.

6.8.6 කළමනාකරණ ක්‍රියාකාරකම්

විගණන නිරීක්ෂණය	අප ආයතනය ගන්නා ලද ක්‍රියා මාර්ගය
(අ) ආයතනයේ අභ්‍යන්තර උපාධි පාඨමාලා සඳහා බඳවාගන්නාලද සිසුන්හට නේවාසිකාගාර පහසුකම් සලසා ඇති අතර මෙම නේවාසිකාගාර 2010 සහ 2014 වර්ෂයන්හි කුලී පදනම මත ලබාගෙන තිබූ බව නිරීක්ෂණය විය. මේ සඳහා 2017 වර්ෂයේ රු. 1,912,800.00 ක මුදලක් ගෙවා තිබූ අතර ආයතනයට ස්ථිරවම නේවාසිකාගාර පහසුකම් ලබාගැනීම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් සකස් කිරීමට කළමනාකාරීත්වය අවධානය යොමුකර නොතිබුණි.	ආයතනයට ස්ථිර නේවාසිකාගාර පහසුකම් ලබාගැනීම සම්බන්ධව ආයතන කලමනාකාරීත්වයේ අවධානය යොමුකර ඇති අතර මේ සඳහා සුදුසු භූමියක් ආයතනය අවටින් සොයා ගැනීම සිදුකරමින් පවතී. මේ වන විට නේවාසිකාගාර පහසුකම් සැලසීමට සුදුසු භූමියක් සෙවීමේ කාර්ය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහාය ඇතිව සිදුකරනු ලබයි.

(ආ) ආචාර්යවරයකුගේ පරිවාස කාලය 2014 අගෝස්තු 03 දිනෙන් අවසන් වී තිබූ අතර පරිවාස කාලය දීර්ඝ කිරීම සම්බන්ධව ඉල්ලීමේ ලිපියක් ඔහු විසින් වාර්තාවේ දින දක්වාම ආයතනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. එසේම මෙම කාලය තුළ ඔහු විසින් සම්පූර්ණ කළයුතු Certificate for Teaching in Higher Education යන පාඨමාලාව 2018 අප්‍රේල් 27 දින දක්වාම සම්පූර්ණ කර නොතිබුණි. කෙසේවුවද පරිවාස කාලය දීර්ඝ කිරීමකින් තොරව ඔහුට වැටුප් රහිත අධ්‍යයන නිවාඩු ලබාදීමට කොළඹ විශ්වවිද්‍යාලයේ නිවාඩු හා සම්මාන කමිටුව (Leave and Awards Committee) 2017 ඔක්තෝම්බර් 30 දින තීරණය කර තිබුණි.	මෙම අචාර්යවරයාගේ පරිවාස කාලය 2017.12.31 දින දක්වා දීර්ඝ කරන ලද අතර ඔහු සිය අධ්‍යයන කටයුතු අවසන් කර නොතිබූ බැවින් වැටුප් රහිත නිවාඩු ඉල්ලා තිබූ අතර ඒ අනුව කොළඹ විශ්වවිද්‍යාලයේ නිවාඩු හා සම්මාන කමිටුව වැටුප් රහිත අධ්‍යයන නිවාඩු ලබා දීමට තීරණය කළ අතර අධ්‍යයන කටයුතු අවසන් කර 2017.12.31 දිනට සේවයට වාර්තා කිරීමට කටයුතු කරන ලෙසද දැනුම් දී ඇත.

6.8.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	**අප ආයතනය ගන්නා ලද ක්‍රියා මාර්ගය**
(අ) අවස්ථා 11 කදී ලබාදුන් එකතු වටිනාකම රු. 347,000.00 වූ අත්තිකාරම් මුදල් පියවීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය වූ අතර ප්‍රමාද කාලය දින 33 සිට දින 169 දක්වා විය.	මෙම අත්තිකාරම් පියවීමේ දී විවිධ හේතූන් මත ප්‍රමාදයන් සිදු වී ඇත. කෙසේ වෙතත් මින් ඉදිරියට මෙවැනි ප්‍රමාදයන් සිදුවීම වලක්වාගැනීම සඳහා අදාල අංශ වෙත සිහි කැඳවීම යැවීම සහ සිහි කැඳවීම් වලින් පසුවද තවදුරටත් පියවීම ප්‍රමාද වන අත්තිකාරම් අදාල අත්තිකාරම් ලබාගත් පුද්ගලයාගෙන් අයකර ගැනීමටද ක්‍රම වේදයක් හඳුන්වා දී ඇත.
(ආ) 2017 දෙසැම්බර් 31 දිනට රු. 11,200.00 ක් වටිනා උත්සව අත්තිකාරම් ශේෂයන් 09 ක් පියවා නොතිබූ අතර නොපියවූ කාල පරාසය වර්ෂ 03 සිට වර්ෂ 10 ක් විය.	රු. 11,200.00 00 ක් වටිනා උත්සව අත්තිකාරම් ශේෂයන් ට අදාල පුද්ගලයන්ගේ අර්ථසාධක අරමුදල් තවම නිදහස් කර නොමැති බැවින් මෙම උත්සව අත්තිකාරම් ශේෂයන් අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

6.8.8 හඳුනාගන්නා ලද පාඩු

විගණන නිරීක්ෂණය	අප ආයතනය ගන්නා ලද ක්‍රියා මාර්ගය
ගිවිසුම් කඩකල ආචාර්යවරුන් තිදෙනෙකුගෙන් 2017 වර්ෂය අවසන් වන විට අයකරගත යුතු මුදල රු. 2,032,948.00 ක් වූ අතර ඉන් ආචාර්යවරුන් දෙදෙනෙකුගෙන් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂය තුළ අයකර ගෙන නොතිබුණි.	ගිවිසුම් කඩකල හිටපු අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයන් ගෙන් අයවිය යුතු මුදල අර්ථසාධක අරමුදලින් අයකර දෙන ලෙසට වන ඉල්ලීම ඔහුගේ කැමැත්තද සමඟ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව වෙත යොමුකර ඇති අතර ඉතිරි ශේෂය අයකර ගැනීම සඳහා නීතිමය කටයුතු ආරම්භකර ඇත. ඒක් ආචාර්යවරයකුගේ අර්ථසාධක අරමුදලින් රු 1,636,185.34 ක් 2018 වර්ෂය තුල අයකර ගන්නා ලදි.

6.8.9 කාර්ය මණ්ඩල පරිපාලනය

විගණන නිරීක්ෂණය	අප ආයතනය ගන්නා ලද ක්‍රියා මාර්ගය
ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයෙහි පුරප්පාඩු 127 ක් පැවති අතර අනුමත කාර්ය මණ්ඩලයෙන් පරිබාහිරව කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 25 දෙනෙකු ද දෛනික ගෙවීමේ පදනම මත හා කාර්ය පැවරුම් පදනම මත සේවකයින් 43 දෙනෙකු වෙත සේවා දිගු ලබා දෙමින් තවදුරටත් සේවයේ යොදවා තිබුණි. මෙසේ 2015 හා 2016 වර්ෂයන්හි ද පුරපුපාඩු පැවති අතර සේවකයන් බඳවා ගැනීමේ කාර්යයන් අප්‍රමාදව සිදුකිරීමට ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි.	මෙම කාර්යමණ්ඩලය සඳහා අනුමැතිය ලැබුනේ 2017 මාර්තු මස වන අතර මෙම කාර්යමණඩල පුරප්පාඩු පිරවීම සඳහා 2017 වර්ෂයේ කාලය ප්‍රමාණවත් නොවීය. නමුත් පුරප්පාඩු පිරවීම 2017 වර්ෂයේ ආරම්භකරන ලදි. එම පුරප්පාඩු පුරවනතෙක් ආයතනයේ කටයුතු පවත්වාගෙන යෑම සඳහා එකී තනතුරුවලට අනුරූපීව කොන්ත්‍රාත් (within the Approved Carder Vacancies) පදනම මත සේවකයන් බඳවාගෙන ආයතනයේ කටයුතු පවත්වාගෙන යා යුතු බවට කළමණාකරන මණ්ඩලය තීරණය කරන ලදි. දැනට ආයතනයේ කාර්යමණ්ඩල පුරප්පාඩු පිරවීම වක්‍රලේඛන වල ප්‍රතිපාදන අනුව සිදු කෙරෙමින් පවතී.

6.8.10 තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ලඟාකර ගැනීම

විගණන නිරීක්ෂණය	අප ආයතනය ගන්නා ලද ක්‍රියා මාර්ගය
2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/ එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත්කරන ලද වක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක්ම විසින්ම කටයුතු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළව කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක වියයුතුද යන්න දැනුවත්වී නොතිබුණි.	මේ වන විට මෙම වක්‍රලේඛය පිළිබඳව ආයතනය දැනුවත් වී ඇති අතර මින් ඉදිරියට වක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.

6.8.11 අයවැය ලේඛනමය පාලනය

විගණන නිරීක්ෂණය	අප ආයතනය ගන්නා ලද ක්‍රියා මාර්ගය
2016 ජනවාරි 01 දිනැති අංක 01/2016 චක්‍රලේඛය මඟින් බාහිර උපාධි පාඨමාලා, බාහිර පාඨමාලා, බාහිර විභාග හා සම්බන්ධිත කාර්යයන් පිළිබඳව ගෙවීම් සිදුකිරීමට මහ පෙන්වීමක් ලබා දී තිබියදීත් ඊට පටහැනි ලෙස නව පාඨමාලා අයවැය ලේඛන පිළියෙල කර ඒ සඳහා මූල්‍ය කමිටු හා පාලක සභා අනුමැතිය ලබා දී තිබුණි.	තොරතුරු තාක්ෂණය සඳහා තරඟකාරී ආයතනයන් මඟින් ගෙවනු ලබන රේටයන් වක්‍ර ලේඛකයට වඩා ඉහල මට්ටමක පැවතීමත් ඒ අනුව තරඟකාරීත්වයට මුහුණ දෙමින් හා එම පාඨමාලාවේ ගුණාත්මය ආරක්ෂාකර ගනිමින් පාඨමාලාව ඉදිරියට පවත්වාගෙන යාම අවශ්‍ය බැවින් මෙම ගෙවීම් රේටයන් අඛණ්ඩව පවත්වාගෙන යෑමට සිදුවී ඇත. මෙම ගැටලුව සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව දැනුවත් කර ඔවුන් ගේ උපදෙස් ලබා ගැනීමට කටයුතු කරමි.

6.8.12 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	අප ආයතනය ගන්නා ලද ක්‍රියා මාර්ගය
(අ) ආයතනයේ අභ්‍යන්තර විගණනය කොළඹ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය වෙත පැවරී තිබුනද ප්‍රමාණවත් විගණනයක් සිදු නොවීමේ හේතුවෙන් 2011 අප්‍රෙල් 01 දින ආයතනයේ විගණන කටයුතු පෞද්ගලික සමාගමක් වෙත පවරා තිබුණි. 2017 දෙසැම්බර් 31 දිනවන විට ප්‍රථම අර්ධ වර්ෂයට අදිළ විගණන වාර්තා පමණක් එම සමාගම විසිනි කළමණාකරනය වෙත ඉදිරිපත්කර තිබුණි.	මෙම අභ්‍යන්තර විගණන ප්‍රමාදය පිළිබඳව ආයතනයේ විගණන කමිටුව සාකච්ඡා කළ අතර ඒ බව අදාල විගණන සමාගම වෙත ලිඛිතව දැනුම් දී ඇති අතර 2018 වසර තුල මෙම ප්‍රමාදය වලක්වා ගැනීමට විගණන සමාගම එකඟ වී ඒ අනුව කටයුතු කර ඇත.
(ආ) මුදල් රෙගුලාසි 134 (3) පරිදි අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත්කර නොතිබුණි.	මෙම වාර්තා විගණන හා කළමණාකරන කමිටුවේ දී රජයේ විගණනය වෙත ලබා දී ඇත. නමුත් ඉදිරියේ දී මෙම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් සෘජුවම රජයේ විගණනය වෙත ලබාදෙන ලෙස අදාල විගණන ආයතවයට දැනුම් දී ඇත.

6.8.13 ප්‍රසම්පාදනය

විගණන නිරීක්ෂණය	අප ආයතනය ගන්නා ලද ක්‍රියා මාර්ගය
(අ) 2017 වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්මේ අන්තර්ගත රු. මිලියන 18 ක් වටිනා ප්‍රසම්පාදනයන් 02ක් සමාලෝචිත වර්ෂයේ දී සම්පූර්ණ කර නොතිබුණි.	මෙම ප්‍රසම්පාදනයන් 02 ක 2018 වර්ෂයේ නිමකළ යුතු බවට කළමනාකරණය තීරණය කරන ලදි. ඒ අනුව එම ප්‍රසම්පාදනයන් 02 ක 2018 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට යලි ඇතුලත් කරන ලද අතර මේ වන විට එම්ප්‍රසම්පාදන ප්‍රදානය කර ඇත.

6.8.14 නොවිසඳී ඇති විගණන ඡේද

විගණන නිරීක්ෂණය	අප ආයතනය ගන්නා ලද ක්‍රියා මාර්ගය
(අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාලයට පටහැනි අයුරින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන අමාත්‍යවරයාගේ නිර්දේශ සහිතව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියෙන් තොරව 2006 දෙසැම්බර් 29 දින පරිගණක ආයතනය තුළ ඇපයෙන් සීමිත සමාගමක් ලෙස සිමාසහිත තීක්ෂණ සමාගම ස්ථාපිත කර 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර තිබුණි. 2009 මාර්තු 02 දින එය නැවතත් 2007 අංක 07 දරන දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර තිබුණි.	ඇපයෙන් සීමිත තීක්ෂණ සමාගම සම්බන්ධයෙන් කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයන ආයතනයේ කිසිදු අයිතියක් හෝ ඒ පිළිබඳව කිසිදු වගකීමක් නොමැති බැවින් එවැනි අනුමැතියක් අවශ්‍ය නොවේ.
(ආ) සීමිත තීක්ෂණ සමාගම වෙනම නීතිමය ඒකකයක් ලෙස ස්ථාපිත කර තිබුණද පරිගණක අධ්‍යයන ආයතනයේ සම්පත් භාවිතා කරමින් අධ්‍යයන ආයතන පරිශ්‍රය තුළ පවත්වාගෙන යනු ලැබේ. සමාගම් ව්‍යවස්ථාවලියේ 32 වන වගන්තියට අනුව සමාගමේ කළමනාකරණ මණ්ඩලයට කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයන ආයතනයේ නිලධාරීන් නිලබලයෙන් පත්විය යුතු බව දැක්වේ. ඒ අනුව සීමිත තීක්ෂණ සමාගම පරිගණක අධ්‍යයන ආයතනයහි සියයට 100ක පූර්ණ පාලන බලය සහිතව පවතින පරිපාලිත සමාගමකි. ඒ අනුව පරිගණක අධ්‍යයන ආයතනයේ මූල්‍ය ප්‍රකාශන සීමිත තීක්ෂණ සමාගමේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. කෙසේ වුවද 2015 දෙසැම්බර් 31 දිනට අදාළව පරිගණක අධ්‍යයන ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තීක්ෂණ සමාගමේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධකර ඉදිරිපත් කර තිබුණි.	බාහිර ආයතනයක ගිණුම් පරිගණක අධ්‍යයන ආයතනයේ ගිණුම් හා ඒකාබද්ධ කල නොහැකි අතර විගණකාධිපතිතුමා විසින් වාර්තාකර ඇති පරිගණක අධ්‍යයන ආයතනයේ ගිණුම් වාර්තා තීක්ෂණ සමාගමේ ගිණුම් හා ඒකාබද්ධ කල යුතු යුතුය යන්න සම්බන්ධයෙන් කිසිසේත් එකග විය නොහැකිය. 2015 වර්ෂයේ විගණකාධිපතිතුමාගේ වාර්තා කිරීමට අනුව කිසිදු තර්කානුකූල පදනමකින් තොරව වැරදි ලෙස පරිගණක ආයතනයේ ගිණුම් හා තීක්ෂණ සමාගමේ ගිණුම් ඒකාබද්ධ කලද, 2016 වසර තුල එය නිවැරදි කල යුතු බවට කළමනාකරණ මණ්ඩලය තීරණය කරන ලදි. මේ සම්බන්ධව අප ආයතනය පහත ක්‍රියා මාර්ග ගන්නා ලදි. -කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයන ආයතනයේ තීක්ෂණ සමාගම සම්පත් භාවිතය සඳහා ආයතනයේ කළමනාකරණ මණ්ඩලය අනුමත කරන ලද මුදලක් තීක්ෂණ සමාගමින් අයකරනු ලැබේ. - කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂක නියෝජ්‍ය අධ්‍යක්ෂක හා අධ්‍යනාංශ ප්‍රධානීන් තීක්ෂණ සමාගමේ සියලු නිලතල වලින් හා සාමාජිකත්වයෙන් ඉවත් වී ඇත. - තීක්ෂණ සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියෙහි කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයන ආයතනය සම්බන්ධ

	වගන්තීන් ඉවත්කරන ලෙස තීක්ෂණ සමාගම වෙත ලිඛිතව දැනුම් දී ඇත.
(ඇ) ආයතනය විසින් සේවකයින් 04 දෙනෙකුට හා ආචාරවරයකුට ලබාදී තිබූ රු. 567,970.00 ක් වූ ආපදා ණය මුදලින් රු. 333,156.00 ක් වර්ෂ 05 සිට වර්ෂ 24 දක්වා කාළයක් තුළ අයකරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.	මෙම සේවකයන්ගෙන් අයවිය යුතු ආපදා ණය හා සේවක ණය ශේෂයන් ඔවුන් ගේ අර්ථසාධක අරමුදල් නිදහස් කරනොමැති නිසා, අර්ථසාධක අරමුදලින් අය කර ගැනීමට අවශ්‍ය කටයුතු කර ඇත.
(ඈ) ආයතනය විසින් සේවකයකු හා ආචාර්යවරයකු වෙත ලබා දී තිබූ රු. 20,400.00 ක සේවක ණය රු. 10,850 ක ශේෂයක් අවුරුදු 24ක් ගතවී ඇතත් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.	මෙම සේවකයන් දෙදෙනාගේ අර්ථ සාධක අරමුදල් නිදහස් කර නොමැති අතර එම මුදල් නිදහස් කිරීමේදී ණය ශේෂයන් අය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.
(ඉ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත පරිදි සෑම විශ්වවිද්‍යාල, මණ්ඩප හා විවෘත විශ්වවිද්‍යාල නියමයක්ම ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබිය යුතුය. ඉන් අනතුරුව එය ක්‍රියාත්මක යන අතර තුර දී හැකිතාක් ඉක්මනින් පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් 2002 අංක 01 දරන කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයන ආයතන නියමාවලිය 2002 නොවැම්බර් 15 දිනැති අංක 1262/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළකර තිබුණද අනතුරුව පාර්ලිමේන්තුව ඉදිරියේ සභාගත කර නොතිබුණි.	මේ පිළිබඳව විශ්වවිද්යාල ප්රතිපාදන කොමිසන් සභාව දැනුවත් කර ඇති අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය එක්ව පාර්ලිමේන්තුවේ සභාගතකිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් සිටී.
(ඊ) පරිගණක අධ්‍යයන ආයතනයෙහි පරිපාලන හා අධ්‍යයන කටයුතු සඳහා ඉදිකර තිබූ මහල් 05 කින් සමන්විත ගොඩනැගිලි සංකීර්ණය පිහිටි ඉඩම කොළඹ විශ්වවිද්‍යාලය සතුවන අතර එම ඉඩමෙහි අයිතිය පවරා ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.	කොළඹ විශ්වවිද්යාලයීය පරිගණක අධියයන ආයතනය යනු කොළඹ විශ්ව විද්යාලය තුල පිහිටි කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන ආයතනයක් බැවින් අයිතිය පවරා ගැනීමක් අවශ්‍ය නොවේ.

මහාචාර්ය කේ. පී. හේවාගමගේ
අධ්‍යක්ෂ

2017

UCSC විශේෂ අවස්ථා

දෘශ්‍යකාව, අවස්ථා සහ ක්‍රියාකාරකම්

7.UCSC විශේෂ අවස්ථා 2017 – දෘශ්‍යතාව, සිදුවීම් සහ ක්‍රියාකාරකම්

UCSC වෙබ් අඩවිය ආයතනයේ විශේෂ අවස්ථා සන්නිවේදනය කරන ප්‍රධාන ද්වාරය යි.2017 දී කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන තේමාව සැලකිල්ලට ගනිමින් UCSC වෙබ් අඩවිය සම්පූර්ණයෙන්ම ප්‍රතිව්‍යුහගත කර ඇත. එයටhttp://www.ucsc.cmb.ac.lk සහ http://www.ucsc.lk යනුවෙන් URL වසම් ද්විත්වයකි. ආයතනයේ ප්‍රගතිය සහ ගැටළු පිළිබඳ විනිවිදභාවය පවත්වා ගැනීම සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ මාසිකව සිදුකෙරෙන ප්‍රධාන ක්‍රියාකාරකම් සිදුවීම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සහ සෙනෙට් මණ්ඩලය දැනුවත් කරනු ලැබේ. ආයතනයේ සියලු ක්‍රියාකාරකම් යාවත්කාලීන කිරීම සඳහා UCSC වෙබ් අඩවිය ප්‍රධාන සමාජ ජාලය සමඟ සම්බන්ධ කර ඇත. එක් එක් මාසයක් විෂයෙහි 2017 වසරේ ප්‍රධානතම අංගයන් පහත වගුවේ දැක්වේ.

7.1 මාසික විශේෂ අවස්ථා

7.1.1 ක්‍රියාකාරකම් , සිදුවීම් සහ වැඩසටහන්

මාසය	ක්‍රියාකාරකම්
2017 , ජනවාරි	• විද්‍යාපති වැඩසටහන සඳහා ශිෂ්‍ය ලියාපදිංචිය 3 වන ජනවාරි ආරම්භ කෙරිණි. • නව කණ්ඩායමේ ප්‍රථම උපාධි සමාරම්භක උළෙල ජනවාරි 11 දින ආරම්භ වී සති දෙකක් සඳහා නම්නීකරණය වැඩසටහන පැවැත්විණි. • තොරතුරු තාක්ෂණ උපාධිය සඳහා නව ලියාපදිංචි කිරීම් ජනවාරි 21 දින ආරම්භ විය. • (NSF) ජාවිප විශිෂ්ඨතා තාක්ෂණික සම්මානය ජනවාරි 31 දින ලැබිණි. මහාචාර්ය එන්. ඩී. කොඩිකාර, ආචාර්ය සී. අයි. කැප්පෙටියාගම සහ ආචාර්ය කේ. ඩී. සඳරුවන් යන කාර්ය මණ්ඩල සාමාජිකයින් ඇතුලත් පර්යේෂණ කණ්ඩායම “සයුර : ත්‍රිමාන වෙරළ පද්ධතිය” වෙත පිරිනැමිණි.
පෙබරවාරි	• විද්‍යාපති උපාධිය සඳහා විෂයමාලා වැඩි දියුණු කිරීමේ වැඩමුළු පෙබරවාරි 7 හා 8 • 2017 සඳහා BIT නව ලියාපදිංචි අවසන් දිනය වූයේ 2017 පෙබරවාරි 15 දිනයි. • IFS ශිෂ්‍යත්ව ප්‍රථම උපාධි ශිෂයින් 8 සඳහා ශිෂ්‍යත්ව පෙබරවාරි 16 දින පිරිනැමිණි. • කලවුඩ් කම්පියුටින්ස් සහ ජීව තොරතුරු විද්‍යාව, ආරාධිත අමුත්තාගේ කථාව ජෝන්ස් හොප්කින්ස් විශ්වවිද්‍යාලයේ ටෙලර්ලැබ් හි පර්යේෂණ විද්‍යාඥ ආචාර්ය එනිස් ඇfපගන් විසින් පෙබරවාරි 20 දින පැවැත්විනි • කොළඹ විශ්ව විද්‍යාලයේ ආයතනික සමාලෝචනයට දායකවූවන් සඳහා ඇගැයීම් පෙබරවාරි 20 දින පැවැත්විනි. • නව ශිෂ්‍ය ලියාපදිංචිය පෙබරවාරි 5, 10, 11, 12, 18, 19 හා 24 දින පැවැත්විනි.
මාර්තු	• එජාසවැ (UNDP) නියෝජිතයින් සමඟ පැවැත්වූ රැස්වීම මාර්තු 3 දින පැවැත්විනි. • විද්‍යාපති වැඩසටහන් 3 සමාරම්භය මාර්තු 4 දින පැවැත්විනි. • වැඩසටහන් සම්පාදක / පද්ධති විශ්ලේෂක තේරීමේ පරීක්ෂණය මාර්තු 4 දින පැවැත්විනි.

	• IEEE ඉංජිනේරු කාර්යයේ කාන්තාවන් SB AG / UCSC වාර්ෂික මහා සභා රැස්වීම මාර්තු 5 පැවැත්විණි • විද්‍යාත්මක සහකාර සඳහා සම්මුඛ පරීක්ෂණය මාර්තු 7, 8, 9, 10 දින පැවැත්විනි. • UCSC කාර්ය මණ්ඩලයේ සුබසාධක සමිතියේ වාර්ෂික මහා සභා රැස්වීම මාර්තු 8 පැවැත්විණි. • උසස් අධ්‍යාපනයට ඩිජිටල් යොදාගැනීම් වැඩමුළුව:කැම්බෝජයේ හා ශ්‍රී ලංකාවේ ICT ධාවිත නවෝත්පාදන සඳහා කාර්ය මණ්ඩල හැකියා වර්ධනය.ශේන්සෙන් නාගරික ආයතනයේ සහාය මත මාර්තු 15 හා 16 පැවැත්වූ UNESCO-Shenzhen Funds-In-Trust Framework ව්‍යාපෘතියකි • තොරතුරු තාක්ෂණ විද්‍යාපති උපාධි වැඩසටහනේ අවසන් වාචික පරීක්ෂණය මාර්තු 17 හා 18 පැවැත්විනි. • 1 වන වසර ශිෂ්‍යයින් සඳහා ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයින් විසින් සංවිධානය කෙරෙන ධර්ම දේශනා වැඩසටහන මාර්තු 23 පැවැත්විනි. • පරිගණක විද්‍යා විද්‍යාපති වැඩසටහන සඳහා අවසන් වාචික පරීක්ෂණය මාර්තු 25 හා 26 පැවැත්විනි. • වැඩසටහන් සමාලෝචනය - වැඩමුළු 1 මාර්තු 30 පැවැත්විනි. • වැඩසටහන් සම්පාදක / පද්ධති විශ්ලේෂක තේරීමේ සම්මුඛ පරීක්ෂණය මාර්තු31 දින පැවැත්විනි
අප්‍රේල්	• අයදුම්කරුවන් 2000ක් පමණ වූ තොරතුරු පද්ධති උපාධි වැසටහන සඳහා වූ තෝරාගැනීමේ පරීක්ෂණය අප්‍රේල් 4 දින පැවැත්විනි. • ‘‘කොටස් වෙළඳපොළ ආයෝජන’’ මාතෘකාව යටතේ සෞදි බ්‍රිටිස් බැංකුවේ ක්‍රියාකාරිත්වයේ අවදානම් හා අභ්‍යන්තර පාලන ජ්‍යෙෂ්ඨ කලමණාකරු මුතුසාමි අශෝකන් මහතාගේ ආරාධිත අමුත්තාගේ කථාව අප්‍රේල් 5 දින පැවැත්විනි. • තත්ත්ව ආරක්ෂණ සහ උපාධි වැඩසටහන් සමාලෝචනය වැඩමුළුව අප්‍රේල් 6 පැවැත්විණි • මිනුම් දෙපාර්තමේන්තුවේ කාර්‍ය මණ්ඩලය සඳහා පැවැත්වූ postgre SQL/QGIS පුහුණු පාඨමාලාව සඳහා සහභාගිවූවන් 20ට සහතික පත් ප්‍රධානය අප්‍රේල් 8 දින පැවැත්විනි. • JavaEE භාවිතා කර උසස් ජාවා යෙදුම් සංවර්ධනය පිළිබඳ පුහුණු පාඨමාලාවට සහභාගි වූ 23 දෙනාට සහතික පත් ප්‍රධානය කරන ලදී. • අෂේන් ජයසේකර මහතා පැවැත්වූ ආරාධිත අමුත්තාගේ කථාව - ‘‘අධිකරණ ගණකාධිකරණය’’ අප්‍රේල් 19 දින පැවැත්විනි. • ‘‘වසන්තේ එරබදු’’ කාර්ය මණ්ඩලයේ සුභ සාධක නව අවුරුදු උත්සවය අප්‍රේල් 20 දින පැවැත්විනි. • පළවන වසර සිසුන් සංවිධානය කල UCSL සූර්ය උදානය 2017 අප්‍රේල් 21 දින පැවැත්විනි. • UCSL සිසුන් පැවැත්වූ ලිනක්ස් ක්‍රියාකාරී පද්ධතිය ස්ථාපනය පිළිබඳ හඳුන්වාදීමේ වැඩසටහන අප්‍රේල් 27 දින පැවැත්විනි. • ‘‘ග්‍රැපික් සැලසුම් හා නිර්මාණාත්මක සංවර්ධනය’’ කෙටි පාඨමාලාව අප්‍රේල් 30 දින සම්පූර්ණ කෙරිනි.
මැයි	• UCSC සිසුන් සංවිධානය කල පැදුර 2017 මැයි 5 දින පැවැත්විනි. • වෙසක් උත්සවය මැයි 10 හා 11 දින පැවැත්වුනි • UCSC, lEEE ශිෂ්‍ය ශාඛාවේ වාර්ෂික මහා සභාව මැයි1 5 දින පැවැත්විනි. • CAKE Labs පැවැත්වූ ‘‘ඔබගේ වෘත්තිය හැඩගසාගන්න.’’ අන්තර්ක්‍රියා කථාව මැයි 15 දින පැවැත්විනි. • UCSC ACM ශාඛාව සංවිධානය කල එඩ්යුලින්ක් අධ්‍යක්ෂක කනිෂ්ක විරමුන්දී මහතා ගේ ආරම්භකයින් සඳහා හඳුන්වාදීමේ සැසිය • UCSC ජයග්‍රහණ 2016 , 24 දින පැවැත්විනි.

	• කොළඹ විශ්වවිද්‍යාලයේ CompSoc - වාර්ෂික මහා සභාව 2017 මැයි 25 දින පැවැත්විනි. • කොළඹ විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනායතනයේ ශිෂ්‍ය සංගමය සංවිධානය කල “නින්නාද 2017 සංගීත ප්‍රසංගය මැයි 26 දින මහරගම තරුණ මධ්‍යස්ථානයේදී පැවැතැවිනි. • BIT සමාසික 1 පරීක්ෂණය මැයි 27 හා 28 දිනවල කොළඹ, යාපනය, නුවර හා ගාල්ලේ දී පැවැත්විනි. • ගංවතුරින් පීඩා වූ ජනයා සඳහා UCSC ශිෂ්‍යයින් ආධාර එකතු කිරීම හො ඔවුන් අතර බෙදා දීම මැයි 29 සහ 30 දිනවල සිදුවිය. • ඉන්දියාවෙන් පැමිණි සෞඛ්‍ය කණ්ඩායමක් පැවැත්වූ “නාඩි විද්‍යාව” පිළිබඳ ආරාධිත කථාව
ජූනි	• ඕස්ට්‍රේලියානු ජාතික විශ්ව විද්‍යාලයේ (ANU)පරිගණක විද්‍යා පර්යේෂණ පාසලේ මහාචාර්ය වූ මහාචාර්ය පීටර් ක්‍රිස්ටන් ඕස්ට්‍රේලියානු ජාතික විශ්ව විද්‍යාලයේ” දත්ත ගැලපුම් පර්යේෂණ” පිළිබඳ පැවැත්වූ ආරාධිත කථාව. • UCSC ශිෂ්‍ය සංගමය සංවිධානය කල කලුතර, ගාල්ල, මාතර සහ රත්නපුර දිස්ත්‍රික්කවල ජල ගැලීම් හා නාය යෑම් වලින් පීඩිත ජනයාට සහාය සැලසීමේ වැඩසටහන ජුනි 2 දින පැවැත්විනි. • MPhil වැඩසටහනේ යෝජනා ආරක්ෂණය ජුනි 6 දින පැවැත්විනි. • ඉලොක්: අඩුමිල අවධිවනික අනාවරක භාවිතයෙන් වල් අලි නිශ්චයනය සංවේදක පද්ධති ව්‍යාප්ති පරිගණනය පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණයේදී DCOSS 2017 ජුනි 09 හොදම පත්‍රිකාවට වූ සංවිධානය ලැබූ බව උප්සලා විශ්ව විද්‍යාලය නිවේදනය කලේය. • ශ්‍රී ලංකා නාවුක හමුදාවේ කණ්ඩායමක ජුනි 16 වූ සංචාරය • ප්‍රථම උපාධි වැඩසටහන් සමාලෝචන වැඩමුළුව ජුනි 21 හා 22 දිනවල පැවැත්විනි. • චීනයේ ටියාන්ජින් විශ්ව විද්‍යාලයේ e-ඉගෙනුම් පර්යේෂණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ සහකාර මහාචාර්ය ආචාර්ය හු හැන්ග් ගේ චීනයේ සහන් ඉගෙනුම පිළිබඳ ආරාධිත කථාව ජුනි 27 දින පැවැත්විනි.
ජුලි	• JavaSE භාවිතයෙන් උසස් ජාවා යෙදුම් සංවර්ධනය පුහුණුව ලැබූ 23 දෙනෙකුට සහතික පත් ජුලි 1 වන දින ප්‍රදානය කිරීම. • Test Automation framework භාවිතයෙන් මෘදුකාංග තත්ව ආරක්ෂකපුහුණුව සඳහා සහභාගිවූවන් ට සහතික ප්‍රදානය ජුලි 2 • BIT enhancement e-Tests UCSC දී පැවැත්වීම ජුලි 3-10 දක්වා • SWOT සංවර්ධනය සඳහා වැඩසටහන් සමාලෝචන වැඩමුළුව 2 ජුලි 5 දින පැවැත්විනි. • අභාවප්‍රාප්ත මහාචාර්ය වී. කේ. සමරනායක මහතා වෙනුවෙන් පැවැත්වූ ඕලන්දේ ආනන්ද භිමියන්ගේ ධර්ම දේශනාව ජුලි 6 දින • FIT පරීක්ෂණයන් සඳහා e-පරීක්ෂණ ජුලි 18-21 පැවැත්විණි • වැඩසටහන් සමාලෝචන වැඩමුළු 3 සහ MIS සඳහා නැවත වාචික පරීක්ෂණය ජුලි 19 දින පැවැත්විනි. • JavaEE භාවිතයෙන් උසස් ජාවා යෙදුම් සංවර්ධනය සඳහා සහතික පත් පාඨමාලාව නව කාණ්ඩයකට ජුලි 29 දින ආරම්භ විය.
අගෝස්තු	• අභ්‍යන්තර ප්‍රථම උපාධි සාමාන්‍ය උපාධි ප්‍රධානෝත්සවය (UCSC වල ශිෂ්‍යන් 193 දෙනෙකු BMICH පැවැත්වූ උත්සවයේදී උපාධි ලැබුහ)අගෝස්තු 1 සහ 2 දින පැවැත්විනි. • දෙවන වසර සිසුන්ගේ වාර්ෂික ආගමික ක්‍රියාකාරකම්, සංඝයා වහන්සේ 50 නමකට දානය අගෝස්තු 2 දින පැවැත්විනි.

	• පරිගණක සේවා මධ්‍යස්ථානය (CSS) විසින් පැවැත්වූ test Automnation framework භාවිතා කර මෘදුකාංග තත්ව ආරක්ෂණය කෙටි කාලීන පාඨමාලාව අගෝස්තු 6 දින ආරම්භ විය. • ක්ලවුඩ්හැක් 17- ඇමේසන් වෙබ් සේවා පිළිබඳඅන්තර්ක්‍රියාකාරී වැඩමුළුව අගෝස්තු 8 දින පැවැත්විනි. • කුරුණෑගල රෝහලේ ක්‍රීඩා වෛද්‍ය දොස්තර උපුල් මඩහපොල මහතා පැවැත්වූ "ක්‍රීඩා වෛද්‍යවිද්‍යාව" පිළිබඳව ආරාධිත දේශනය • බුද්ධාභිවන්දනා 2017 UCSC පළවන වසර සිසුන් විසින් සංවිධානය කල වාර්ෂික භක්ති ගීත වැඩසටහන අගෝස්තු 9 දින පැවැත්විනි. • පත්‍රිකා සමාලෝචන වැඩමුළුව -ICTer සම්මන්ත්‍රණය 2017 පැවැත්විනි. • ISAC ශිෂ්‍ය ශාඛාවේ සිසුන් ක්ලවුඩ් හැක් 2017 අගෝස්තු 12-13 දක්වා පැවැත්විනි. • UCSC ACM ශිෂ්‍ය ශාඛාව විසින් පැවැත්වූ ICTA සමග හඳුන්වාදීම, ස්වේච්ඡාවන් පිළිබඳ සැසිවාරය අගොස්තු 21 දින පැවැත්විනි. • UCSC අභ්‍යන්තර ප්‍රථම උපාධි වාර්ෂික ක්‍රීඩා දිනය අගෝස්තු 25 දින පැවැත්විනි. • UCSC මොසිලා සමාජය සංවිධානය කල පොක්ස්පෘතර් 2017- ආරාධිත කථිකයන් චතුරි ගලප්පත්ති (EPIC තාක්ෂණික සමූහයේ මානව සම්පත්, උප සභාපති) සහ දිලීප රාජපක්ෂ (කෝඩ් ස්ටඩ් ඕර්ගනයිශේෂන් සහ- ආරම්භක) අගෝස්තු 29 දින පැවැත්විනි. • පර්යේෂණ සහයෝගිතා හැකියාව පිළිබඳ බ්‍රිමේන විශ්ව විද්‍යාලයේ ආචාර්ය ඇන්ඩ්‍රියස් ජේ කොන්ස්ජෙන්ගේ කථාව අගෝස්තු 31 පැවැත්විණි.
සැප්තැම්බර්	• සයිබර් ආරක්ෂණය පිළිබඳ UCSC ISACA ශිෂ්‍ය කණ්ඩායම සංවිධානය කල iCS හමුව • සැප්තැම්බර් 6 • නව බහුකාර්ය ගොඩනැගිල්ලේ පිරිත් සජ්ජායනාව • UOC 50 වසරක පරිගණනය සැමරීම • එක්සත් රාජධානියේ රීඩින්ග් හි මහාචාර්ය රොජර් ඩි ස්ටන් ගේ විද්‍යාජෝති මහාචාර්ය වී. කේ. සමරනායක මහතාගේ සිහිකිරීමේ දේශනය • මහාචාර්ය වී.කේ. සමරනායක ශ්‍රවණාගාරය සමග නව බහුකාර්ය ගොඩනැගිල්ල විවෘත කිරීම. • 17 වෙනි IEEE ICTer 2017 අන්තර් ජාතික සම්මන්ත්‍රණය විවෘත කිරීම. • ICTer සම්මන්ත්‍රණයේ පෙර වැඩමුළු හා නිබන්ධන • වැඩමුළු 1: මෘදුකාංග නිදොස්කිරීම - සම්පත් දායක : මහාචාර්ය අභික් රොවෙඩිරි (ACM කථික) • නිබන්ධන 1: පාඨ විශ්ලේෂණ - සම්පත් දායක ආචාර්ය රුවන් වීරසිංහ • 17 වන IEEE ICTer 2017 ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේ තාක්ෂණික සැසිවාර සැප්තැම්බර් 7 හා 8 දින පැවැත්විනි. • ICTer පෙර IEEE පසු වැඩමුළු සැප්තැම්බර් දින පැවැත්විනි. • UCSC පෙර IEEE Extreme 2.0 සැප්තැම්බර් 9 • ශ්‍රී ලංකා පරිගණක සංගමය (CSSL) සමග සහයෝගතාවයෙන් පැවැත්වූ ජාත්‍යන්තර පාසල් මෘදුකාංග තරගය සැප්තැම්බර් 11 සිට 13 දක්වා පැවැත්විය. • IEEE WIEUCSC ශිෂ්‍ය ශාඛාවේ අනුබද්ධ කණ්ඩායම විසින් පැවැත්වූ උ.පෙළ GIT දැනුවත් කිරීම සැප්තැම්බර් 13 පැවැත්විනි. • පරිගණක සේවා මධ්‍යස්ථානය (CSS) මගින් පැවැත්වූ JavaEE භාවිතයෙන් උසස් ජාවා යෙදුම් සම්මන්ත්‍රණය සඳහා සහභාගි වූවන් 14 සඳහා සහතික දීම සැප්තැම්බර් 16 දින පැවැත්විනි. • පරිගණක සේවා මධ්‍යස්ථානය (CSS) පැවැත්වූ මෘදුකාංග තත්ව ආරක්ෂණ පාඨමාලාව සඳහා සහභාගි වූවන් 23 සැප්තැම්බර් 17 දින සහතික පත් ලැබීය.

	• 1000 SLICT මට්ටම් හඳුනාගැනීමට ශාන්ත පීතර විද්‍යාලයේදී පැවැත්වූ තෝරාගැනීමේ පරීක්ෂණය සැප්තැම්බර් 23 පැවැත්විනි. • ‘‘සයිබර් ආරක්ෂණය: දැනුවත් කිරීම සහ ආරක්ෂණය’’ කොළඹ එ. ජ. තානාපති කාර්යාලයේ තොරතුරු කලමනාකාරීත්ව විශේෂඥ කෙවින් බෘනර්, සැප්තැම්බර් 26 පැවැත්විනි. • දෙවැනි වසර සිසුන් සංවිධාන කල ‘‘අභිධාරා’’ වාර්ෂික නවකයින්ගේ පිළිගැනීම - 2017 සැප්තැම්බර් 30 පැවැත්විනි.
ඔක්තෝම්බර්	• IFS ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවය ඔක්තෝබර් 3 දින පැවැත්විනි. • මහියංගන මැඩියාව කනිෂ්ඨ විද්‍යාලයට UCSC ගවේෂණාත්මක සංගමය ශිල්ප යාත්‍රා 2017 - පරිගණක විද්‍යාගාරය තිළිණ කිරීම. ඔක්තෝම්බර් 4 දින පැවැත්විනි. • පාසිකුඩා, අමායා බීච් හොටෙල් හිදී පැවැත්වූ වාර්ෂික කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන • 4 වසර සිසුන් විසින් සංවිධාන කල රැකියා පොල 2017 ඔක්තෝම්බර් 9 දින පැවැත්විනි. • ආචාර්ය ඊ. ලොකුපිටිය පැවැත්වූ විශ්වවිද්‍යාල යේ උත්සවයන් වලදී පොලිතින් හා දිරාපත් නොවන නිෂ්පාදන භාවිතා කිරීමෙන් වැලකීම පිළිබඳ දැනුවත් කිරීමේ සැසිය ඔක්තෝම්බර් 10 දින පැවැත්විනි. • UCSC IEEE ශිෂ්‍ය ශාඛාව විසින් සංවිධානය කල IEEE දිනය 2017 ඔක්තෝම්බර් 11 පැවැත්විණි. • තරුණ පරිගණක වේදීන්ගේ තරඟය 2017-2 වන වටරවුම ඇගැයීම් ඔක්තෝම්බර් 14 පැවැත්විනි. • IEEEXtream 11.0 – IEEE මගින් සංවිධානය කල වැඩසටහන් පිළිබඳ අන්තර්ජාතික තරගය ඔක්තෝම්බර් 14 දින පැවැත්විනි. • ස්ථාවර වත්කම් කලමණාකාරීත්වය පිළිබඳ වැඩමුළුව (කාර්යමණ්ඩල සංවර්ධනය පසුවිපරම් ක්‍රියාකාරකමකි. ඔක්තෝම්බර් 18 දිනවල පැවැත්විනි. • වානිවිෂා 2017 - UCSC ද්‍රවිඩ සිසුන් සංවිධානය කල සංඝකෘතික උත්සවය ඔක්තෝම්බර් 26 දින පැවැත්විනි. • හැකහොලික්ස් 2.0 ගැහැණු ළමුන් පමණක් වූ හැකකොන් IEEE කාන්තා - ශිෂ්‍ය ශාඛාව විසින් ඔක්තෝම්බර් 28 පැවැත්විනි. • පරිගණක සේවා මධ්‍යස්ථාන සංවිධානය කල ජාවා යෙදුම් සංවර්ධන පාඨමාලාව සඳහා සහභාගිවූවන් 30 සහතිකපත් ඔක්තෝම්බර් දින 28 ලැබීය. • පරිගණක සේවා මධ්‍යස්ථාන සංවිධානය කල’’ වෘත්තීය සංවර්ධනය සඳහා පරිගණනය’’ පාසල් හැරගියවුන් සඳහා පාඨමාලාව 2017 – 1 වන වැඩසටහන ඔක්තෝම්බර් 29 ආරම්භ විය. • BIT ශික්ෂණ ආයතන නියෝජිතයින් සමග වූ රැස්වීම ඔක්තෝම්බර් 31 පැවැත්විනි.
නොවැම්බර්	• JavaSE සහතිකපත්‍ර පාඨමාලාව නව කණ්ඩායමක් සඳහා නොවැම්බර් 4 දින පැවැත්විනි. • විද්‍යාපති වැඩසටහන සඳහා ලියාපදිංචි කිරීම අවසාන දිනය නොවැම්බර් 8 දින විය. • කින්ග්ස්බරි හෝටලයේදී පැවැත්වූ Epihack තරගය නොවැම්බර් 10 දින පැවැත්විනි. • කොළඹ විශ්ව විද්‍යාල සඳහා වූ UNESCO ඉගෙනුම් වැඩමුළුව නොවැම්බර් 14 දින පැවැත්විනි. • විෂය මාලා සංවර්ධන වැඩ මුළුව නොවැම්බර් 16 පැවැත්විණි

	.
දෙසැම්බර්	• තොරතුරු තාක්ෂණ (බාහිර) උපාධි වැඩසටහන උපාධි ප්‍රධානෝත්ස්වය මහාචාර්ය වී .කේ . සමරනායක ශ්‍රවණාගාරයේදී දෙසැම්බර් 6 දින පැවැත්විනි. • ඩිප්ලෝමා හා උසස් ඩිප්ලෝමා වැඩසටහන් ප්‍රධාන උත්සවයන් NAT හිදී දෙසැම්බර් 6 දින පැවැත්විනි. • ICANN ප්‍රජාව හා UCSE ඒකබද්ධ වැඩමුළුව දෙසැම්බර් 11 – 15 UCSC දී පැවැත්විනි. • රූට්සෝන්, කොළඹ, ශ්‍රී ලංකාව සඳහා වූ සිංහල අක්ෂර LGR පිළිබඳ වූ වැඩමුළුව • ශ්‍රී ලංකාව සඳහා ICANN කොමියුනිටි අවුට්රීච් සැසිය • Joint Neo – Brahmi G P – Sinhala GPS meeting Colombo Sri Lanka • විද්‍යාපති ව වැඩසටහන (MCS 272/309, MIT 151/164, MIS58/69) සඳහා තෝරාගැනීම් පරීක්ෂණය දෙසැම්බර් 17 දින පැවැත්විනි. • Mphil/Phd අතුරු ව්‍යවස්ථා ප්‍රතිශෝධන වැඩමුළුව, පාල්මිස් හොටෙල්, ගල්කිස්සේ දී දෙසැම්බර් 19 දින පැවැත්විනි. • UCSC පළවන වසර සිසුන් සංවිධානය කල වාර්ෂික පිරිත් සජ්ජායනාව සහ දානය දෙසැම්බර් 19 හා 20 පැවැත්විනි. • 2016/ 2017/ CS198/ 201, 1S101/101) ප්‍රථම උ උපාධි නව බදවාගැනීම් ලියාපදිංචිය දෙසැම්බර් 20 දින පැවැත්විනි. • 2017 පශ්චාත් උපාධි ප්‍රධානොත්සව යේ සම්මානලාභීන් හා අනුග්‍රාහකයින් ඇගයීමේ උත්සවයක් දෙසැම්බර් 21 දින පැවැත්විනි.







